ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"තවද, වාක්‍යාණෝ මාංශවත්වී කරුණාවෙන්ද, සත්‍යයෙන් ද පූර්ණව අප අතරෙහි වාසය කළ සේක. " (යොහාන් 1:14)

81 වන වෙළුම අංක 02 (962) **2022 මාර්තු / අප්‍රෙල්**

ක්‍රිස්තුස් වහන්සේගේ මහිමයේ සුභාරංචිය

චාර්ල්ස් එච්. ස්පර්ජන් විසිනි

මෙම වාක්‍යයේ දීප්තිය මුතු කැටයක් මෙන් දිදුලන්නට සලස්වා තිබෙනවා 2 කොරින්ති 4:4 වන පදයේ දී ඔබට සොයාගත හැකිය. **"දෙවියන් වහන්සේගේ ස්වරූපය වූ ක්‍රිස්තුස් වහන්සේගේ තේජසේ ශුභාරංචි ආලෝකය ....."** (2 කොරින්ති 4:4) පාවුල්තුමා එක අදහසක සිටි මනුෂයෙකි. පින්නෙන් තෙමුණා වූ ගිඩියොන්ගේ ලොම් මිටිය මෙන් පාවුල්ගේ ආත්මය ක්‍රිස්තුස් වහන්සේ සුභාරංචියෙන් පෙගුණේය. එම නිසා ක්‍රිස්තුස් වහන්සේ කුරුසපත්වීමේ තේජස හැර වෙන කිසිවක් සිතන්නටවත් වෙන කිසිවක් ගැන කථා කරන්නටවත්, ඔහුට පුළුවන් වූයේ නැත. අපෝස්තුළුවරුන්ගේ කාලයේ දී දේශපාලනිකව වැදගත් දේ සිදු විය. නමුත් ඒවා ගැන සඳහන් කිරීමක් මට මතක නැත. මහත් වූ සමාජීය ගැටලු විසඳීමට තිබුණත් ඔහුගේ එකම විසඳුම වූයේ මහත් වූ ගැලවුම්කරුවාණන්ගේ දේශනාවයි. මක්නිසාද පාවුල්තුමාට ජීවත්වීමට තිබුණේ වටිනා එක් කාරණයකි. ඒ කාරණය උදෙසා ඔහු මරණයට ද පත් වූයේය. ඔහු ක්‍රිස්තුස් වහන්සේ තුළ ජයග්‍රාහිකව සිටීමට වඩා තම ජීවිතයටවත් ප්‍රිය කළේ නැත.

ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලිකත්වය

සුභාරංචියේ තේජස සහ ඉනපසුව අපගේ ස්වාමීන් වහන්සේගේ පුද්ගලික ජීවිතයේ ඇති තේජස ප්‍රකාශ වූ සේක. උන්වහන්සේ මනුෂ්‍යයාගේ ගැලවුම්කාර දෙවියන් වහන්සේ වන සේක. **"පියවරුදැ ඩවුන්ගේය. මාංසාකාරයන් ක්‍රිස්තුස් වහන්සේ පැවුණුනෙන් ඩවුන්ගෙන්ය. උන්වහන්සේ සියල්ලන්ටම උතුම් වූ සදාකාල ආශිර්වාදලත් දෙවියන් වහන්සේය. ආවේන් ..."** (රෝම 9:5) දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ කුළුදුල් පුත්‍රයා ලෝකයට ගෙන එන විට සියලු දේවදූතයන් උන්වහන්සේට නමස්කාර කළ යුතු යැයි ලියානැද්ද ... ? (හෙබ්‍රෙව් 1:6) යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ වශයෙන්, දේවදූතයන් සමඟ අපි උන්වහන්සේට නමස්කාර කරමු. අපගේ මිදුම්කරුවාණන් මනුෂයෙක් ලෙස පැමිණි සේක. අප වාගේම මනුෂ්‍යයෙක් වූ සේක. මේ හැර උන්වහන්සේ තුළ ස්වභාවික දූෂිත ක්‍රියාකාරකම්වල කිසිඳු කැළලක්වත්, කිසිඳු පාප ක්‍රියාවක්වක්වත් උන්වහන්සේගේ චරිතය තුළ තිබුණේවත් නැත. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ තේජස තුළ පැවතුනු අතර මනුෂ්‍යයන්ට පුදුමාකාරයෙන් සම්බන්ධව සිටියා වූ පුද්ගලයෙකු වූ සේක. උන්වහන්සේ අද්විතීයව සිටි සේක. උන්වහන්සේ පියාණන් වහන්සේගේ තේජසේ දීප්තිය සහ දුෂ්කරතාවය උදෙසා ඉපදුනා වූ අපගේ කුළුදුල් සහෝදරයා විය.

සුභාරංචිය මෙයයි. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් උන්වහන්සේගේ තේජස ඇතිව මුනුෂ්‍යාගේ ගැලවීම බාරගත් සේක. එබැවින් මනුෂ්‍යකාරය ගෙන අප අතරට පැමිණි සේක. උන්වහන්සේගේ තේජස දෙස අපි බැලිය යුතුය. රෝගීන්ගෙන් පිරුණු විශාල රෝහලක් මෙහි අපට තිබේනම් ඔවුන් බැලීමට පැමිණි ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයා ඔවුන්ගේ සුවය උදෙසා කැපවූ බවට වඩා හොඳ ආරංචියකින් ඔවුන්ට පවසන්නේ නම් එය දුක් විඳිමින් සිටින අයට හොඳ පණිවිඩයක් වනු ඇත. ඔබට උපකාර කිරීමට පැමිණෙන වෛද්‍යවරයා නොවරදින ප්‍රඥාවෙන් හා නොවරදින දක්ෂතාවයකින් යුක්ත වන අතර ඔහු තුළ පවතින ආදරණීය මීදු මොළොක් බව සහ අසීමිත බලයක් ඇති බව මට ඔවුන්ට පැවසිය හැකි නම් ඔවුන් තමන්ගේ ඇඳමත සිට සිනාසෙමින් සිටින්නේ කොයි ආකාරයෙන්ද ?

එම ප්‍රවෘත්තිය පැමිණීමෙන් රෝගී තත්ත්වෙයන් අඩක් යථා තත්ත්වයට පත්වේ. ගලවනු ලැබීමට පැමිණ සිටින්නේ වෙන කිසෙවෙකු නොව දෙවියන් වහන්සේගේ මහිමාන්විත ක්‍රිස්තුස් වහන්සේ බව ඇසූ විට බලාපොරොත්තු සුන් වූ ආත්මයන් සමඟ එය ඊට වඩා කොපමණ වැඩියෙන් විය යුතුද ? සුභාරංචියේ ප්‍රධාන ආධාරකය ක්‍රිස්තුස් වහන්සේගේ පුද්මාකාර වූ පුද්ගලිකත්වයේ උදාර බවයි. ගැලවීම ලබාදීම දේවදූතයෙකුටවත් කිසිම මනුෂ්‍යයෙකුටවත් නුපුළුවන. නමුත් උන්වහන්සේ **"එවිවානුවෙල්"** (**දෙවියන් වහන්සේ අප සමඟ වන සේක.**) (මතෙව් 1:22-23) උන්වහන්සේගේ අසීමිත වූ කරුණාව, උන්වහන්සේගේ අසීමිත වූ මැවීමේ ක්‍රියාවලින් ප්‍රකාශ වේ. ඔබ පවුකරුවෙක් ලෙස පුස්තැවිල්ලේ ඇඳ මත වේදනාවෙන් මිය යාමට යද්දී ඔබට එවැනි ගැලවුම්කරුවෙකුව අවශ්‍ය විය. බලාපොරොත්තු සුන් වූ විට සහ ඔබ කළ යුතු කුමක්දැයි සිතන විට උන්වහන්සේ කවුද කියා සිතට ගන්න.

මම ගැලවුම්කරුවාණන්ගේ දේවත්වය පිළිබඳව ඔබට සැකය ඇති කළොත් ඔබට ඇති බලාපොරොත්තුවේ එකම මග අයින්කර දමනවා ඇත. නමුත් ඒ අතරම ඔබ උන්වහන්සේ දෙවියන් වහන්සේ ලෙස දකින්නේ නම් උන්වහන්සේට කිසි දෙයක් අමාරු නොවන බව ඔබ මතක තබාගත යුතුය. උන්වහන්සේගේ සැබෑ මනුෂ්‍යය ස්වභාවය ගැන මම ඔබට සැකය ඇති කරනවා නම්, මම ඔබගේ සැනසිල්ල කොල්ලකන්නෙමි. ඒ හේතුවෙන් උන්වහන්සේගේ ලේ නෑකමේ සම්බන්ධතාවයෙන් ඔබ තුළ වැඩෙන මෘදු මොළොක් අනුකම්පාව ඔබ හඳුනාගන්නේ නැත. ප්‍රේමවන්තයෙනි, ස්වාමී වූ යේසුස් වහන්සේ සදාකාලික දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය කරුණාකොටගෙන ඔබ ඉදිරියේ සිටින සේක. ස්වාමීන් වහන්සේගේ ආත්මය සීමා රහිතව උන්වහන්සේ තුළ පවතින ප්‍රථම සහ හොඳම ගැලවීමේ පණිවිඩය ඔබට වඩාත් සම්පූර්ණව සහ විශ්වාසනීයව තිබේ. උන්වහන්සේගේ මහිමය අපට සුභාරංචියයි.

ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය

යේසුස් ක්‍රිස්තුස් වහන්ස්ගේ තේජස තුළ පුද්ගලිකත්වයය පමණක් නොව උන්වහන්සේගේ ප්‍රේමයත් පවතින සේක. සුභාරංචිය තුළත් එය පවතින බව මතක තබාගන්න. සදාකාලිකවම දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් උන්වහන්සේගේ සෙනඟට ප්‍රේම කරන සේක. **"උන්වහන්සේගේ වාසයට යෝග්‍ය වූ ලෝකය ගැන සන්තෝෂවෙමින් මනුෂ්‍යය පුත්‍රයන් සමීපයෙහි ප්‍රීතිවුනෙමි."** (හිතෝපදේශ 8:31) යේසුස් වහන්සේ මනුෂ්‍යයෙක් ලෙස පොළොවට පැමිණීමට බොහෝ කලින් පියාණන් වහ්නසේ උන්වහන්සේට දුන්නා වූ මනුෂ්‍යයන්ට ප්‍රේම කළ සේක. ඒ හැම කෙනෙක් සමඟම වාසය කිරීමට ස්ථිරව තීරණය කළ සේක. ඔවුන්ගේ මිදීම උදෙසා යේසුස් වහන්සේ තමන් වහන්සේගේ ජීවිතයෙන් ඒ භයංකාර මිලට ගෙවූ සේක. උන්වහන්සේ තෝරාගත්තවුන් පිළිබඳව සම්පූර්ණයෙන්ම උන්වහන්සේගේ සර්වඥානය නිසා පැහැදිලිව දුටු සේක. එමෙන්ම සදාකාලික ප්‍රේමයකින් ඔවුන්ට ප්‍රේම කළ සේක. පටන්ගැන්මේ සිට අපගේ මිදුම්කරුවාණන්ගේ හදවතේ එම ප්‍රේමය ඉතා උණුසුම් ලෙස පවතින සේක. එම ආදරය කිසිදා අවසන් වන්නේ නැත.

මෙහිදී උන්වහන්සේගේ තේජස උන්වහන්සේගේ ප්‍රේමය අප උදෙසාය. ස්වර්ගයට උන්වහන්සේව නතර කර තබා ගැනීමට නොහැකි විය. උන්වහන්සේ අපට ප්‍රේම කළ නිසා අපව මුදා ගැනීමට උන්වහන්සේ පොළාවට පැමිණි සේක. අපගේ පාපය සහ ලැජ්ජාව මධ්‍යයේ උන්වහන්සේ අප අතරේ වාසය කරමින් මේ දක්වා අපට ප්‍රේම කරන සේක. **"පාස්කු මංගල්‍යයට පළමුවෙන්, යෙසුස් වහන්සේ මේ ලෝකයෙන් පිටත්ව පියාණන් වහන්සේ ළඟට යන තමන්ගේ පැය පැමිණ තිබෙන බව දැන, ලෝකයෙහි සිටියා වූ ස්වකීය සෙනඟට ප්‍රේමයෙන් සිට අන්තිම ද්කවා ඩවුන්ට ප්‍රේම කළ සේක."** (යොහාන් 13:1) දිව්‍යමය ගැලවුම්කරුවාණන්ගේ හදවත තුළ තිබෙන ප්‍රේමයේ උපරිමයට අපට ළඟාවිය හැකිය. එමෙන්ම උන්වහන්සේගේ ප්‍රේමයේ තේජසට ආරම්භයක්, සීමාවක්, වෙනස්වීමක් හෝ අවසානයක් නොමැති අතර මෙය ප්‍රේමයේ සභාරංචියේ රුධිරයයි. යේසුස් වහන්සේගේ ප්‍රේමයේ සතුට මහත් වූ ප්‍රීතියේ පුවතයි. අපගේ මහත් වූ වෛද්‍යවරයා රෝගීන්ව සිටින්නන්ට ප්‍රේමකරමින් ඔවුන්ව සුව කිරීමට මහත් සේ සතුටින් සිටින සේක. උන්වහන්සේ අංශභාගී රෝගීන් සහ වසංගතයෙන් පීඩා විඳි අය අතරේ වාට්ටුවලට පැමිණෙන්නේ ඔවුන්ට ආශිර්වාද කිරීමේ දැඩි ආශාවෙන් වන සේක. යේසුස් වහන්සේ පව්කරුවාගේ මිත්‍රයයා. මගේ ආත්මය යේසුස් වහන්සේ ප්‍රේමණීය තැනැත්වහන්සේ

2 පිටුවට

1 පිටවෙන්

ක්‍රිස්තුස් වහන්සේගේ මහිමයේ...

නිසා කොපමණ උද්යෝගයෙන් උන්වහන්සේට ගායනා කරනවාද ... ? යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමණීය තේජස තුළ කරුණාවේ සුභාරංචිය පවතින්නේය.

ක්‍රිස්තුස් වහන්සේගේ මාංශවත්වීම

ඊළඟට අපි උන්වහන්සේගේ මාංශවත්වීම තුළ තේජස දකින්නෙමු. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ බෙත්ලෙහෙමේ උපත ලැබූ විට සහ නාසරෙත් නුවර වාසය කරද්දී අපි උන්වහන්සේගේ තේජස දකින්නෙමු. උන්වහන්සේ වඩුවෙකුගේ පුත්‍රයෙකුවීම අගෞරවයක් සේ පෙනෙන නමුත් අපගේ මාංසය සහ රුධිරයට පංගුකාරවීමෙන් උන්වහන්සේගේ මැදහත්කාරකම් මහිමය සෑම කාලයකටම පෙනෙන්නේය. මෙහිදී උන්වහන්සේගේ දිළිඳුකම සහ අපකීර්තිය, ලැජ්ජාව තුළ මහිමය ඇත. උන්වහන්සේට හිස තබන්නට තැනක් නොතිබීමෙන්, උන්වහන්සේගේ විඩාව සහ කුසගින්න තුළ මහිමය ප්‍රකාශ වේ. ගෙත්සෙමනේ උයනේදී දහඩිය ලේ මෙන් ගලා වැටෙද්දී සහ කල්වාරි කුරුසියේ මැරෙන විට උන්වහන්සේගේ මහිමය ප්‍රකාශ විය. කෙළ ගසා අපහාස කිරීමෙන්, කසයෙන් තැලීමෙන්, ඇණ ගැසීමෙන් ලැබුණා වූ කීර්තිය ලබාදීමට වෙන කිසිවකට නොහැකි විය.

කරුණාවේ, දයාවේ මහිමය මාංශවත් වූ දෙවියන් වහන්සේ වටකර පැවතුණ සේක. මෙයින් පාපය දැඩි ලෙස ඒත්තු ගන්වන්නේය. එය සුභාරංචියයි. දෙවියන් වහන්සේගේ මාංශවත්වීම අපි දකින විට උන්වහන්සේ සමඟ නැවත සමගිවීම අපේක්ෂා කරන්නෙමු. දීර්ඝ කාලයක් තිසේසේ පවතින අපගේ දුබලතාවයන් සහ රෝගී තත්ත්වයන් උන්වහන්සේ දරාගත් බව අපි දකින විට සුවය පිළිබඳව සහ සමාවීම පිළිබඳව අපට බලාපොරොත්තුවක් ලැබේ. කන්‍යාවියක තුළින් උපත ලබා අපගේ ස්වාමීන් වහන්සේ අප අතරට පැමිණිය සේක. උන්වහන්සේ පොළොව මත ජීවත් වෙමින්, සේවය කරමින් දුක්විඳි සේක. එයින් අපට බලාපොරොත්තුව ලැබී තිබේ. උන්වහන්සේ ලෝකයට පැමිණියේ ලෝකයා හෙළා දමන පිණිස (විනිශ්චය කරන පිණිස) නොව ලෝකයා ගලවාගන්නා පිණිසය. (යොහාන් 3:17) යහපත කිරීමේ, දයාවේ, ආශ්චර්යමත් දේ කිරීමේ, වැටුණා වූ අයට මෘදු මොළොක් රැකවරණය ලබාදීමේ, උන්වහන්සේගේ ජීවිතයේ තිබූ මහිමය ඔබට ලැබෙන පිණිස මම ඔබ වෙනුවෙන් යාච්ඤා කරමි. සියලු මනුෂ්‍යයන් අතරේ පවතින දුක්විඳීම් සඳහා සුභාරංචිය උන්වහන්සේගේ ජීවිතය තුළ නොමැතිදැයි ඔබගෙන්ම අසන්න.

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ මහිමයෙන් දූවිලි වූ අපගේ පහත් තත්ත්වය වසා දැමූ සේක, ඊළඟට උන්වහන්සේ අදහස් කළේ මනුෂ්‍යයා යහපත් බවයි. උන්වහන්සේ මනුෂ්‍යත්වය සම්පූර්ණයෙන්ම හෙලා දකිමින් පිළිකුල් නොකළ සේක. දේවත්වය සමඟ ඒකත්වයට පැමිණීමෙන් ගෞරවයට පත්කරනු ලැබීය. වචනය මාංශවත්වීමෙන් දෙවියන් වහන්සේගේ මහිමය අපි දකින්නෙමු. ප්‍රේමය ප්‍රමුඛවන්නේ කෙසේද කියාත්, අනුකම්පාව රජකරන්නේ කෙසේද කියාත් ප්‍රකාශවීමෙන් අදහගන්නා වූ සෑම මනුෂ්‍යයෙකු සඳහාම කරුණාවේ සුභාරංචිය මේ තුළින් අපි දකින්නෙමු.

ක්‍රිස්තුස් වහන්සේගේ වන්දිගෙවීම් පූජාව

ක්‍රිස්තුස් වහන්සේගේ වන්දි ගෙවීමේ පූජාවීම තුළ තවදුරටත් උන්වහන්සේගේ තේජස පෙනුණේය. නමුත් ඔබ මාව නතර කර මෙලෙස පැවසිය හැකිය. එය තුළ පැවතියේ උන්වහන්සේගේ නින්දාව සහ ලැජ්ජාව වන බවයි. ඔව් එය සැබෑය. එබැවින් එය උන්වහන්සේගේ මහිමය විය. ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසියේ මරණය උන්වහන්සේට ප්‍රේමකරන්නා වූ සෑම හදවකටම සියල්ලට වඩා තේජවත් නොවේද.. ? අපගේ ප්‍රේමවන්තයාණන් ලෙස උන්වහන්සේගේම ලේ වලින් පූජකකමේ වස්ත්‍රය හොඟවා නොගත්සේක්ද ...? උන්වහන්සේ මුළුමනින්ම ප්‍රේමණීයව සිටන සේක. උන්වහන්සේ කැමති ආකාරයකට ඔබව පිළියෙල කිරීමට උන්වහන්සේට ඉඩ දෙන්න. අපගේ විශ්වාසයේ හදවත් උන්වහන්සේගේ ලේ වලින් වැසී තිබෙන විට, අපි උන්වහන්සේ දෙස බලා සිටින්නේ පුදුමාකාර විශ්මයකින් සහ ප්‍රබෝධමත් ප්‍රේමයකිනි. රාජකීය දම්පාටට වඩා උන්වහන්සේගේ වස්ත්‍ර මත ගලා ගිය රතුපිට ලේ මහිමාන්විත විය. උන්වහන්සේගේ දුක්විඳීමේ සලකුණු දකින විට, අපි සම්පූර්ණ ගෞරවයෙන් යුක්තව උන්වහන්සේගේ පාමුල වැටෙමු.

අපගේ මරණයට ආදේශයක් ලෙස උන්වහන්සේව සෑම දෙයකින්ම පහදා නොදෙන සේකද ..? ප්‍රේමවන්තයෙනි, මෙය සුභාරංචියට අත්‍යවශ්‍යව පවතින්නේය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප වෙනුවට දුක්වින්ද සේක. **"අප පාපවලට නැසී ධර්මිෂ්ඨකමට ජීවත්වන පිණිස, උන්වහන්සේව තමන්ගේ ශරීරයෙන් ගසපිටදී අපගේ පාපයන් ඉසුලූ සේක. උන්වහන්සේගේ තුවාල වලින් නුඹලා සුවකරනු ලැබුවහුය. "** (1 ප්‍රේත්‍රුස් 2:24) යේසුස් වහන්සේගේ කුරුසියේ තේජස (මහිමය) අන් කිසි දෙයකට වඩා මහත් වූ මහිමයක් බව නැවත තහවුරු කරන බවට අපට සුභාරංචියයි. උන්වහන්සේ දිව්‍යමය විනිශ්චයේ අපගේ ස්ථානය ගෙන කුරුසියේ දී මුළු බර දරාගත් සේක. මැටි භාජන මෙන් අපව කඩා දැමීමට හැකි වූ දෙවියන් වහන්සේගේ යකඩ සැරයැටිය උන්වහන්සේ පිටට කඩා වැටුණේය. **"මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත්, මරණය එසේය. කුරුසියේ මරණය දක්වා කීකරු වූ සේක."** (පිලිප්පි 2:8) උන්වහන්සෙව කෲර ලෙස මරාදැමුවත්, උන්වහන්සේ මරණයේ බලය පරාජය කළ සේක. එනම් යක්ෂයාව පරාජය කළ සේක.

ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීම

යේසුස් වහන්සේගේ නැවත නැගිටීමේ තේජස අපට වඩා පහසුවෙන් දැනෙන ස්ථානය වෙතට දැන් අපි ගමන් කරන්නෙමු. මරණයේ බැඳුම් කරුණුකොටගෙන උන්වහන්සේව නතර කර තබා ගැනීමට නොහැකි විය. උන්වහන්සේ මැරුණු සේක. උන්වහන්සේගේ ශුද්ධ වූ ශරීරය මරණයට පත්වූ නමුත් කුණුවීම දක්නට නොහැකි විය. සොහොන් ගෙයි සැතපී සිට අතර නිදහස සහ ආලෝකය ඇතිව උන්වහන්සේගේ නැවත උට්ඨානවීම කරුණුකොටගෙන ජීවමාන දෙවියන් වහන්සේව මහිමයට පැමිණි සේක. යේසුස් වහන්සේගේ නැවත නැගිටීම ගැන මහිමය ප්‍රකාශ කරන්නේ කවුද .. ?

යේසුස් වහන්සේගේ නැවත නැගිටීම අපගේ නිදොස් බව මුද්‍රාකර තබන සේක. උන්වහන්සේ සොහොන් ගෙයින් නැවත නැගිට මරණයේ වහල්කමට හසුව සිටින්නන් නිදයස් කළ සේක. **" ඒ පුත්‍රයාණන් වහන්සේ මාංසාකාරයෙන් දාවිත්ගේ වංශයෙන් ඉපිද. ශුද්ධකමේ ආත්මයේ ප්‍රකාරයට දේව පුත්‍රයාණන් හැටියට මළවුන්ගෙන් නැගිටීම කරුණු කොටගෙන බලයෙන් යුක්තව ප්‍රකාශ කරනු ලැබූ සේක."** (රෝම 1:5) අප ප්‍රීතිමත් වන්නේ යේසුස් වහන්සේගේ මරණය ගැන පමණක් නොව උන්වහන්සේ ජීවමානව සිටීමින් අප වෙනුවෙන් මැදහත්කාරකම් කරන නිසාත්ය. මෙය අපට සුභාරංචිය වී තිබේ. මක්නිසාද උන්වහන්සේ ජීවත්වන නිසා අපිද ජීවත්වන්නෙමු. **"එබැවින් උන්වහන්සේ කරුණුකොටගෙන දෙවියන් වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහතකම් කරන පිණිස උන්වහන්සේ නිරතුරුවම ජීවත්ව හෙයින් ඔවුන් කෙළවර දක්වාම ගලවන්ට උන්වහන්සේට පුළුවන."** (හෙබ්‍රෙව් 7:25) නැවත නැගිටුනාවූ අපගේ ස්වාමීන් වහන්සේටමහිමය වේවා. එය ගැඹුරින් සලකා බලන්න. ගැඹුරින් මෙනෙහි කරන්න. ඔබ එසේ කරන වි ටමහත් වූ, ප්‍රීතිමත් වූ සුභාරංචියේ ප්‍රීතිමත් හඬ ඇසෙනු ඇත. අපගේ මහත් වූ අස්වැසිල්ල (සැලසිල්ල) සඳහා මෙම නියෝගය හෝ පොරොන්දුව දෙස නොබලමු. මක්නිසාද යේසුස් වහන්සේම මළවුන්ගෙන් උට්ඨානවීමෙන් අපගේ දොම් පැවරීමේ සිරගෙදරින්, බලාපොරොත්තු සුන්වීමේ සිරගෙදරින් සහ මරණයේ සොහොන් ගෙයින් නිදහස්වීමේ ස්ථිර පොරොන්දුව සහ සහතිකය ලබා දී තිබෙන සේක.

ක්‍රිස්තුස් වහන්සේගේ සිංහාසනාරූඩවීම සහ දෙවන පැමිණීම

නැවත වාරයක් අපගේ ස්වාමීන් වහන්සේගේ සිංහාසනාරූඩවීම සහ දෙවන පැමිණීම තුළ උන්වහන්සේගේ මහිමය වෙතට ඔබගේ ඇස් ඔසවා බලන්න. උන්වහන්සේ පියාණන් වහන්සේගේ දකුණු පැත්තේ වාඩිවී සිටින සේක. කලින් ලැජ්ජාවේ ගසේ එල්ලී සිටි උන්වහන්සේ දැන් විශ්මයේ ආධිපත්‍යයේ සිංහාසනාරූඩව සිටින සේක. උන්වහන්සේගේ අත්වල ඇණ පහර වෙනුවට උන්වහන්සේගේ අතේ ඇති ලෝකය පාලනයේ ආශිර්වාදලත් යස්ටිය දෙස බලන්න. සියලුම දේ උන්වහ්නසේගේ දෙපා යටතට දමා ඇත. දුක්විඳීමේ මරණය උදෙසා යේසුස් වහන්සේව දේව දූතයන්ට වඩා මදක් පහත කරනු ලැබූ සේක. නමුත් දැන් තේජසේ සහ ගෞරවයේ ඔටුන්න දරා සිටින සේක. (හෙබ්‍රෙව් 2:9) මෙය අපට සුභාරංචියයි. පැහැදිලිවම උන්වහන්සේ අපගේ සියලු සතුරන්ගෙන් අපට ජයදී, ස්වර්ගයේ සහ පොළොවේ සියලු බලය අපට ලබා දී තිබෙන සේක. දෙවියන් වහන්සේ සමඟ උන්වහන්සේව පිළිගැනීම යනු උන්වහන්සේට ප්‍රේම කරන සියල්ලන්ගේ පිළිගැනීම වන අතර උන්වහන්සේව විශ්වාස කරන සියල්ලටන්ටම උන්වහන්සේ ප්‍රේම කරන සේක.

යේසුස් වහන්සේ තේජසින් යුතුව සිංහාසනයේ වැඩිවී සිටීම උන්වහන්සේගේ ලේ වලින් මුදාගනු ලැබුවා වූ සියලුම දෙනා නියමිත වෙලාවට එහි වාඩිවන බවට පොරොන්දුවකි. අපගේ දිව්‍යමය බලාපොරොත්තුව වූ යේසුස් වහන්සේගේ දෙවන පැමිණීම අපි දවස්පතා බලා සිටින්නෙමු. සමහර විට අපි රාත්‍රියේ නින්දට යාමට පෙර දෙවියන් වහන්සේගේ හොරණෑ නාදය ඇතිව ස්වර්ගයෙන් බැස එනු ඇත. ධර්මිශ්ඨයන් ඔවුන්ගේ පියාණන් වහන්සේගේ රාජ්‍යයේ සූර්යයා මෙන් බබලන්නෝය. (මතෙව් 13:43, 1 තෙසලෝනික 4:13-18) එවිට අපගේ වෙහෙසකාරී දවස් අවසන් වන්නේය. භාෂාමය ආරවුල්, පාපයට විරුද්ධව පොරබැඳීම්, වැරදි උපක්‍රම යන සියලුම දේ අවසන් වන්නේය. සැබෑව සහ ශුද්ධකම අති ශ්‍රේෂ්ඨ ලෙස රජකම් කරන්නෝය.

මාගේ සහෝදරයෙනි, භාෂාවේ සහ මුඛයේ ඇති බාධාවන්ගෙන් මිදී මෙම අපහසු අවයව නොමැතිව මගේ හදවතේ ඇති දේ කථා කිරීමට හැකි නම් අද දින උන්වහන්සේගේ මහිමාන්විත ප්‍රකාශවීම සිදුවෙන්නාවූ පැයේදී මගෙ ස්වාමියාගේ දිව්‍යමය සිංහාසනය මත සිට මම ඔබව සතුටු කරන්නමේ. යොහාන් තුමා පත්මොස් දූපතේදී උන්වහන්සේව දුටුවාක් මෙන් අපට උන්වහන්සේව දැකීමට පුළුවන් නම් අපි උන්වහන්සේගේ දෙපාමුල සිහි මූර්ජාවනු ඇත. එම නිසා බලාපොරොත්තු සුන්වීමෙන් නොව, අපගේ ඔසවා ගැනීමේ බලාපොරොත්තුව ඇතිව සිටින්නෙමු. මෙය සලකුණු කරගන්න. ඔබ ක්‍රිස්තුස් වහන්සේ තුළ අඩුවෙන් පවතින තරමට ඔබට විශ්වාස කිරීමට ඇති සුභාරංචිය අඩුවේ. ඔබ ඔබගේ විශ්වාසයෙන් ක්‍රිස්තුස් වහන්සේව අහක් කරන්නේ නම් ඒ අවස්ථාවේදීම සුභාරංචියේ මුළු පණිවිඩය ඔබ තුළ විනාශවී යනු ඇත.

ක්‍රිස්තුස් වහන්සේව ප්‍රකාශ කරන්න.

අපි වැඩියෙන් සුභාරංචිය ප්‍රකාශ කරන විට, අප වැඩියෙන් ක්‍රිස්තුස් වහන්සේව ප්‍රකාශ කිරීම අවශ්‍ය වේ. ඔබ සුභාරංචිය ඔසවනවා නම් ඔබ ක්‍රිස්තුස් වහන්සේව ඔසවන්නේය. ක්‍රිස්තුස් වහන්සේව උසස් නොකර ඔබ සුභාරංචිය දේශනා කිරීමට සිහින දකිනවා නම් ඔබ සැබෑ රොටී වෙනුවට මනුෂ්‍යයන්ට පොතු (ලෙලි) දෙනවා ඇත. යේසුස් වහන්සේ උසස් වූ සිංහාසනයේ මහිමාන්විත ලෙස සිටීම නිසා මනුෂ්‍යයන්ගේ ගැළවීමට උන්වහන්සේ ප්‍රමාණවත් ලෙස සැහෙන්නේය. ක්‍රිස්තුස් වහන්සේව කුඩා ලෙස දැක්වීමෙන් අදහස් කරන්නේ සුභාරංචිය කුඩාවට දැක්වීමයි. නමුත් සැබෑ සුභාරංචිය ක්‍රිස්තුස් වහන්සේගේ මහිමයේ සුභාරංචියයි.

"යේසුස් වහන්නසේ, නැවත නැගිටීම ද, ජීවනය ද මමය " (යොහාන් 11:25)

වෙහෙසට පත්වූවන්ට වචනයක්

රිව් කැම්වෙල් විසිනි

පෙරමඟ දූතයා නව කලාපයක් සකස් කිරීමේ එක් ආශිර්වාදයක් නම් ඒකාබද්ධ පණිවිඩ හරහා අවසන් පිටපෙත් සකස් කිරීම සඳහා පිළියෙල කළ පණිවිඩ කියවන තුරු අපි නොදැන සිටි එකිනෙකාට සම්බන්ධ තේමාවන් සොයා ගැනීමයි. දෙවියන් වහන්සෙ උන්වහන්සේගේ අනර්ඝ වූ ආශිර්වාද ලබාදීමට සහ කාර්යමණ්ඩලයටත්, කියවන අයටත් විශේෂ පණිවිඩයක් ලබාදීමට මේ වටිනා මැණික් වැනි දේ හරි වෙලාවට අපට මතක්කර දුන් බව අපි විශ්වාස කරන්නෙමු.

උදාහරණයක් වශයෙන් මෙම කලාපයේ ප්‍රධාන තේමාව ලෙස "ක්‍රිස්තුස් වහන්සේගේ තේජස" ඇතුළත් කර තිබේ. ඒ සමඟම උන්වහන්සේගේ මරණය, නැවත නැගිටීම, දෙවන පැමිණීම සහ අපගේ යාච්ඤාවේ අවශ්‍යතාවය ඇතුළත් වී තබේ. මේවා නිසැකවම ඉතා උසස් ලෙස වැදගත් වන අතර ඔබව ගැඹුරින් ධෛර්යමත් කිරීමට පුබුදුවාලීමට සහ මෙම පණිවිඩ කරුණුකොටගෙන ඔබට අභියෝගයක් දීමට අපි බලාපොරොත්තු වන්නෙමු. එම නිසා ඔබ ප්‍රශ්න කරදර සහ සොද්සි කිරීම්වලට මුහුණ දී සිටින්නේ නම් මේ මාතෘකා සමඟ ඔබ විශේෂ වූ ආශිර්වාද ලබන්නට යන බව අපි සොයා ගත්තෙමු. වෙහෙසට පත්වූවන් සඳහා ස්වාමීන් වහන්සේගේ සැලකිල්ල උන්වහන්සේ අපට දී තිබෙන පොරොන්දු සහ අපට ලබාදෙන උපකාරය කොපමණ පුදුමාකාරදැයි උපුටා දක්වන්නාවූ දේවලින් මතක් කර දෙන්නේය.

ප්‍රශ්නය වී තිබෙන්නේ අප අතරින් සමහර අය යේසුස් වහන්සේගේ පූර්ණත්වය පිළිබඳව කවදා හෝ ඉගෙන ගත්තා ද යන්නයි. අපි මුහුණ දෙන දේවලදී අපගේම ස්වභාවයේ සහ තත්වයේ අසීමිත අවශ්‍යතා සමඟ අපි මුහුණට මුහුණ නොගැටුණේ නම් අප අතරින් සමහර අය යේසුස් වහන්සේගේ සම්පූර්ණත්වය ඉගෙන ගනු ඇද්දැයි යන්න ප්‍රශ්නයයි. එම නිසා අපි යේසුස් වහන්සේ සමඟ ගමන් කරද්දී උන්වහන්සේ අපගේ අවශ්‍යතාවලදී පූර්ණව සිටින බව අපි සොයාගන්නෙමු.

පොළොව යට අඳුරු සිරගෙදරින් පිටතට පැමිණෙන පිණිස උන්වහන්සේගේ නාමයෙන් මොරගසන්න. උන්වහන්සේට මොරගසන අය වෙතින් උන්වහන්සේගේ හුස්ම හෝ කන් වළක්වා සඟවාගන්නේ නැත. අපි උන්වහන්සේට මොරගසන විට උන්වහන්සේ වෙතට අපව ඇදගන්නා සේක. භය නොවන්න කියා උන්වහන්සේ අපට පවසන සේක. උන්වහන්සේ අප ගැන ඉතා ඕනෑකමින් සලකන බැවින් උන්වහන්සේ අපගේ ආත්මය මුදන සේක. (එච්.බී. මේයර්)

ඔබ මහත් දුෂ්කරතාවයන් මධ්‍යයේ සිටින්නේ නම් ස්වාමීන් වහන්සේ ඔබට ගැඹුරු සැනසිල්ල ලබාදෙන සේකැයි අපි බලාපොරොත්තු වන්නෙමු. ඔබ එවැනි වූ සත්‍යතාවයන් ඔබගේ සිතට ගෙන ක්‍රිස්තුස් වහන්සේ වෙතට සහ වඩා සම්පූර්ණ ලෙස යාච්ඤා කිරීම වෙතට හැරෙන්න ඔබගේ වාතාවරණය කුමක් වුවත් කමක් නැත. ඔබව ගැඹුරින් ධෛර්යමත් කිරීමට, ඔබගේ ජීවිතයේ සහ සේවයේ ප්‍රබෝධය සහ නැණගුණ දියුණු කිරීමට මෙම පණිවිඩ තුළින් අපි බලාපොරොත්තු වන්නෙමු. ස්වාමීන් වහන්සේගේ ගැඹුරු ලෙස අප ගැන සැලකිල්ල දක්වා උන්වහන්සේගේ වචනය, උන්වහන්සේගේ ප්‍රේමය, විශේෂයෙන් උන්වහන්සේගේ පුත්‍රයාණන් තුලින් අප සමඟ බෙදා ගැනීම කොයිතරම් පුදුම සහගතද ? **" එහෙත් අපගේ ස්වාමී වූ ගැලවුවිකාර වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කරුණාවෙහිද, උන්වහන්සේගේ දැනගැනීමෙහිද වර්ධනය වෙයල්ලා. දැනටත් සදාකාලටයත්, උන්වහන්සේට ගෞරවය වේවා. ආමේන්."** (2 පේත්‍රුස් 3:18)

ක්‍රිස්තුස් වහන්සේ සමඟ නැවත නැගිටීම

ඒ.බී. සිම්ප්සන් (1843-1919) විසිනි

"ඉදින් නුඹලා ක්‍රිස්තුස් වහන්සේ සමඟ නැගිටුවනු ලද්දහු නම් උසස් තැනෙහි තිබෙන දේවල් සොයපල්ලා. එහි ක්‍රිස්තුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ දකුණු පැත්තේ වැඩහිඳින සේක. පොළොවේ තිබෙන දේ නොව උසස් තැනෙහි තිබෙනදේම සලකාපල්ලා. වක්නිසාද නුඹලා මළහුය. නුඹලා ජීවනය ක්‍රිස්තුස් වහන්සේ සමඟ දෙවියන් වහන්සේ තුළ සඟවා තිබේ. අපේ ජීවනය වන ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශවන කළ නුඹලාත් උන්වහන්සේ සමඟ තේජසින් ප්‍රකාශවන්නහුය." (කොලොස්සි 3:1-4)

කිතුණුවන්ගේ කාරණාවලට යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීම ඉතා වැදගත්ව තිබේ. එය හාස්කම්වල හාස්කමයි. එය කොනේ ප්‍රධාන ගලේ දිවුමය එළිදරව් කිරීමයි. එය බිඳහෙළිය නොහැකි අත්තිවාරමයි. එය අපගේ ගැලවීමේ ආධාරකයයි. යේසුස් ක්‍රිස්තුස් වහ්නසේගේ නැවත නැගිටීම සුභාරංචියේ සත්‍යතාවයට මහත් සාක්ෂියක් පමණක් නොවේ. අපගේ ආත්මික ජීවිතයේ උල්පතත් එයයි. මෙම කාරණා කොලොස්සි යැවුම් පත්‍රයෙන් ඉහතින් උපුටා දක්වා ඇත. ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීමට අපගේ සම්බන්ධකම ඇතිකර තිබෙන විශේෂ වූ කාරණා පහක් මෙහි සඳහන් වේ. අපි ක්‍රිස්තුස් වහ්නසේ සමඟ උට්ඨානවීම, අපි ක්‍රිස්තුස් වහන්සේ සමඟ මරණයට පත්ව තිබීම ක්‍රිස්තුස් වහන්සේ සමඟ අපගේ ජීවනය සඟවා තිබීම, ක්‍රිස්තුස් වහන්සේ අපගේ ජීවිතයයි. එමෙන්ම අපි ක්‍රිස්තුස් වහන්සේගේ තේජසින් යුතුව ප්‍රකාශ වන්නෙමු.

ක්‍රිස්තුස් වහන්සේ සමඟ උට්ඨානවීම

ක්‍රිස්තුස් වහන්සේ තුළ අපගේ පරණ ජීවිතය පවිත්‍ර වෙනවා. යහපත්කමට පමුණුවනවා සහ අඩුපාඩු ඉවත්කර ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත්ව තිබෙනවා පමණක් නොවේ. ගැලවුම්කරුවාණන් ලෙස අපි උන්වහන්සේව පිළිගත් විට ස්වර්ගයෙන් කෙලින්ම පැමිණෙන්නාවූ සම්පූර්ණයෙන්ම අලුත් ජීවිතයකට උපත ලබන්නෙමු. ආදම් ඔහුගේ මුලින් තිබූ නිර්දෝෂභාවය ඇතිව උදෑසන ඒදන් උයනේ සිටි විට ඔහුගේ ශරීරයේ ඒවගේ මූද්‍රව්‍යය දරා සිටියාක් මෙන් පසුව ඇය ඔහුගේ ශරීරයේ ඇට වලින් ඇට ලෙස සැදී පිටතට පැමිණි ආකාරටයම යේසුස් වහන්සේත් යෝසෙප් තමාට පිළියෙල කරගෙන තිබුණු සොහොන් ගෙයින් දීප්තිමත් උදෑසන නැවත නැගිටුණු සේක. එමෙන්ම තවමත් නූපන් උන්වහන්සේගේ මුළු සෙනග උන්වහ්නසේ තුළ දරා සිටින සේක. ක්‍රිස්තුස් වහන්සේව පිළිගනු ලබන්නා වූ එකින් එක පුද්ගලයා උන්වහන්සේ තුළින් පිටතට පැමිණෙන්නේය. උන්වහ්නසේගේ මූල ද්‍රව්‍යය ඇතිව පිටතට පැමිණි අපගේ ජීවිත සම්පූර්ණයෙන්ම අළුත් දිව්‍යමය සහ ක්‍රිස්තුස් වහන්සේගෙන් ලැබුණා වූ එකක් වේ.

යම් මොහොතකදී අපගේ ජීවිත සම්පූර්ණයෙන්ම ක්‍රිස්තුස් යේසුස් වහන්සේට යටත් කිරීමේ සහ අපගේ ජීවිත උන්වහන්සේට හිමිකරදීමේ ප්‍රතිඵලය ලෙස අපි මැරී නැවත නැගිටුණු අය ලෙස දෙවියන් වහන්සේ ගණන් ගනු ලබන සේක. මේ කාරණය ඉදිරියට ගෙනයාමේ දී යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ පාපයට සහ පරණ ජීවිතයට මැරුණා වූ අපි දෙවියන් වහන්සේ උදෙසා ජීවත්වන අය වශයෙන් ගණන් ගනු ලබන්නෙමු.

ක්‍රිස්තුස් වහන්සේ සමඟ මරණයට පත්වීම.

අපි සදාකාලිකවම මරණයට පත්වන්නේ නැත. නමුත් වරක් අපි මරණයට පත් විය. අපගේ ජීවිත පාපයට මැරී පසුව අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේ උදෙසා ජීවත්වන අය ලෙස ගණන් ගනු ලබන්නෙමුව. යම් එක්තරා කාරණාවන් තුළ පමණක් අපි මරණයට පත් නොවන නමුත් සෑම කාරණයක් තුලම අපි මරණයට පත්වන්නෙමු. අපගේ අතීත ජීවිතයේ කොටසක් පමණක් අපි ඉවත්කර නොදමන අතර අපගේ මුලු පරණ ජීවිතයම ඉවත් කර දමන්නෙමු. එතැන් පටන් අපි කලින් සිටිය පුද්ගලයා හැටියට ජීවත් නොවන්නෙමු. මේ සියලුම දේ මුලින්ම හඳුනාගත යුත්තේ තමාගේම මනා අවබෝධාත්මක හැගීමකින් නොව අපගේම කැමැත්තේ ක්‍රියාවලිනි. අපගේ ජීවිත පාපය වෙනුවෙන් මරණයට පත්විය යුතු අතර ඉන්පසුව අපි වේගයෙන් දැනගැන්ම තුළ සිටගන්නෙමු. එය ක්‍රියාවක් වශයෙන් වර්ධනය වන විට ඊළඟට මනා අවබෝධයක් ඇතිවේ.

ක්‍රිස්තුස් වහන්සේ තුළ සඟවා ඇත.

මෙම සත්‍යතාවය දැන් ප්‍රකාශ කරන ලද සිතුවිල්ල සමඟ රැගෙන යයි. එනම් අප සතුව ඇති ජීවිතය පිළිබඳව අපි නොදැනුවත්ව සිටීමයි. අපි සාමාන්‍ය ඇදිහිල්ලේ ප්‍රථම අවස්ථාවේදීම මෙම අයිතිවාසිකම ඉල්ලා සිටිමින් ස්ථීර ලෙස එය හිමිකරගත යුතුය. අපි එසේ කරන සෑම විටම දිව්‍යමය කරුණාවේ සහ උපකාරයේ සැපයීම අපි අත්දකිනවා ඇත. අපි දැනුවත්ව සිටින්නේ එක් මොහොතක සැපයීමක් පමණක් වන අතර ඊළඟට පැමිණීමට තිබෙන්නාවූ සැපයීමේ උල්පත අපගේ දෑස්වලින් සැඟවී තිබේ. ඇත්ත වශයෙන්ම අප බොහෝ විට ඊළඟ අත්දැකීමට යොමු වන්නේ සම්පූර්ණයෙන්ම හිස්ව, බලාපොරොත්තු රහිතව සහ අසරණභාවය පිළිබඳ හැගීමක් ඇති තත්වයකිනි. නමුත් දෙවියන් වහන්සේ පියවරක් පාසා පියවරක් අපව උන්වහන්සේ මත දරාගෙන ඉදිරියට ගෙන යාමට අපව මුණ ගැසීමට බලා සිටින සේක. උදාහරණයක් වශයෙන් අපට අසාමාන්‍ය ලෙස ආදරය ඉවසීම අවශ්‍යය වන ස්ථානයකට අපව කැඳවනු ලැබූ විට මෙම වරප්‍රසාදය සම්පූර්ණයෙන්ම අඩුවී තිබෙන බව හැගෙන්නේ නම් අපි එය ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලා සිටිමින් ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ස්ථානයේ සිටිය යුතුය. එවිට උන්වහන්සේ අපගේ හදවත්වල සිට ප්‍රේමයෙන් සහ ඉවසීමෙන් හුස්ම ගැනීමට සලස්වන බව අපි අත්දකින්නෙමු. ඒ නිසා අපට ජය ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

4 පිටුවට

3 පිටවෙන්

ක්‍රිස්තුස් වහන්සේ සමඟ නැවත...

එසේ නැති නම් සමහර අවස්ථාව ජයග්‍රහණය සඳහා ධෛර්යය අවශ්‍ය ස්ථානයකට අපව කැඳවිය හැකිය. එම ධෛර්ය්‍ය අපගේ හදවත්වල නොමැති බව අපි දකින අතර අසරණ බව සහ බෙලහීනකම ඇති බව දකින්නෙමු. නමුත් අපි නොදුටුවා වූ ශක්තියේ උල්පත වන උන්වහන්සේගේ හදවතේ ශක්තිය සමඟ විශ්වාසනීය උපකාරය ඉල්ලා සිටිමු. අපි උන්වහන්සේගේ පොරොන්දුව මත සිටින විට උන්වහන්සේ අපව මුණගැසී ජයග්‍රහණය ලබා ගැනීමට හැකියාව සහ ජයග්‍රහණය ප්‍රකාශ කිරීමට හැකියාව ලබාදෙන සේක. මක්නිසාද ස්වාමී වූ දෙවියන් වහන්සේ මට උපකාර වන සේක. එබැවින් වියවුල් නොවෙමි. එබැවින් මාගේ මුහුණ ගිනිගලක් මෙන් තබාගෙන සිටිමි. මා ලැජ්ජාවට නොපැමිණෙන බව දනිමි. (යෙසායා 50:7)

ක්‍රිස්තුස් වහන්සේ අපගේ ජීවනයයි

අපි අපගේම ශක්තිය මත රැඳී ක්‍රියා නොකරන්නෙමු. අපගේ ශක්තිය සෑම මොහොතකම අපට ඉහළින් අපගේ සමීපයේ සහ අප තුළ සිටින්නා වූ ස්වාමීන් වහන්සේගෙන් ලබා ගන්නෙමු. එය සදාකාලයෙන් සදාකාලයටම ඒ ආකාරයෙන් පවතින නමුත් අපි එය පාවිච්චි කරනවාද .. ? අපව පහසුවෙන්ම ස්වර්ගය දක්වා ඔසවා තැබීම සඳහා අපට උසුලාගෙන සිටීමට හෝ අපව පහළට දැමීමට උන්වහන්සේගේ ශක්තියට හැකිය. අප කළ යුත්තේ එයට සම්බන්ධවී සිටීමයි. ඉන්පසුව එහි ක්‍රියාකාරීත්වය සමඟ ගමන් කරමින් උන්වහන්සේගේ බලයේ කොටස්කරුවන් වෙමු. නමුත් බොහෝ විට අපට අවශ්‍යව තිබෙන්නේ අපගේම ශක්තියේ බලය මත රැඳී සිටීමටයි. මේ ආකාරයේ ජීවිතය පහසු නමුත් **ජීවිතයේ දෙවියන් වහන්සේගේ උසස් වූ ස්ථානවලට ගමන් කිරීමට හැකි වන්නේ නැත. එවෙන්ම ජීවිතයේ සෝදිසි කිරීම් සහ පරීක්ෂාවකින් පැවිඤ්ඤන විට ජීවිතයේ පියවර පහළට ගමන් කිරීමට නැඹුරුවෙන්නේය. අපට වහත් ලෙස ශක්තිය අවශ්‍ය වූ විට ප්‍රශ්න කාදාර වැදීන් නොසෙල්වන්නා වූ පර්වතය වන සර්ව බලධාරී ක්‍රිස්තුස් වහන්සේ වෙතට අපව ගෙන යන සේක.**

ක්‍රිස්තුස් වහන්සේ සමඟ තේජස තුළට

ක්‍රිස්තුස් වහන්සේගේ නින්දාවේ දවස්වලදී මෙන් දැන් අපගේ ජීවිත සැඟවී ඇත. නමුත් අන් වෙසක්වීමේ කන්දේදී උන්වහන්සේ තේජසින් යුතුව ප්‍රකාශ වූ සේක. අපි උන්වහන්සේව එලෙස දකින විට අපිත් උන්වහන්සේ මෙන් වන්නෙමු. සමහර විට ඔබ රාත්‍රියේ දී ගිනිකෙළි සන්දර්ශනයක් පැවැත්වීමට නියමිතව තිබූ පොදු ස්ථානයක් හරහා දිවා කාලයේ දී ගමන් කර ඇති අතර ආලෝකමත් කිරීමට සූදානම් කර තිබෙන ඒවා ඔබ දැක ඇත. ආලෝකය තුළ ඒවා සරල හා පොදු පෙනුමකින් පැහැදිලිව දැකිය හැකිය. මනුෂ්‍යයන්ගේ ස්වරූපය, රජුගේ නළලේ ඔටුන්න සහ රජුගේ ආභරණ රළු දළ සටහන් වලින් ඔබට දැකිය හැකිය. නමුත් එහි අංලකාරයක් හෝ තේජසක් දැකීමට නොහැකිය. නමුත් රාත්‍රියේ සන්දර්ශනය ආරම්භ වූ විට දීප්තිමත්ව දැල්වෙන ආලෝකය දැකිය හැකිය. සියලුම රූප දැල්වෙන ආලෝකය මත පවතින්නේය. ඒවා සියල්ලම අස්වභාවිකව, වෙනස්ම ආකාරයකින් සහ දීප්තිමත්ව ප්‍රදර්ශනය වේ.

ඒ ආකාරයෙන්ම ක්‍රිස්තුස් වහන්සේ දර්ශනයවී අපගේ නින්දා සහගත ශරීර උන්වහන්සේගේ තේජසින් ආලෝකමත් කරන සේක. සැකයක් නොමැතිව උන්වහන්සේ නැවත උන්වහන්සේගේ මුළු තේජස අනාවරණය කරන සේක. උන්වහන්සේගේ එම ආලෝකය තුළ ස්වර්ගීය මනමාලියගේ තේජස ප්‍රකාශ වේ. යේසුස් වහන්සේ මෙලෙස පැවසූ සේක. අප ඒකත්වයක්ව සිටින්නා සේම ඔවුනුත් ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් මහිමය ඔවුන්ට දුනිමි. (යොහාන් 1:22) මෙය අපගේ නැවත නැගිටීමේ ජීවිතයේ අපේක්සා කරන තත්වයයි. මෙය ආත්මය, ප්‍රාණය සහ ශරීරය සම්පූර්ණයෙන් මිදීම සහ උන්වහන්සේගේ නැවත පැමිණීමේ පෙරමඟ දූතයන් තුළ පවතින දිව්‍යමය තේජසයි.

හිමිකර නොගත් අපගේ වස්තුව

ක්‍රිස්තුස් වහන්සේ තුළ අපගේ ස්වර්ගීය ආත්මික ආශිර්වාද අංශ තුනකට බෙදිය හැකිය.

පළමුවන අංශය, අපි ගැලවීම හිමිකර ගැනීමත් සමඟම ක්ෂණිකව අප වෙත පැමිණෙන ඒවාය. එවැනි ආශිර්වාද නම්, සමාවදීම, නිදොස් බව, අධ්‍යාත්මිකව නැවත පිඹිදීම ලැබීම, දෙවියන් වහන්සේගේ පුත්‍රකම සහ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය තුළට බෞතිස්මවීම වේ. මේවා අපට හිමිව තිබෙන බව අපි කලින් දැනගෙන සිටියත් ශුද්ධ ලියවිල්ල අධ්‍යයනය කිරීමෙන් පසුව එය වඩා හොඳින් අවබෝධ වේ.

දෙවෙනි අංශය නම්, ඇත්තටම අපගේ ස්වාමීන් වහන්සේගේ නැවත පැමිණීම තෙක් එම උරුමය තුළ ප්‍රීතිවීමට නුපුළුවන. මෙයට සීමාවක් නැති (උපරිම) මානසික සහ සදාචාරමය පරිපූර්ණත්වය, අපගේ ශරීර මහිමාන්වතිවීම, අපගේ මිදීම තුළ නැවත ගොඩනගන්නා වූ (පුනර්ජීවනය ඇති කරන්නා වූ) දිව්‍යමය ස්වභාවයේ අවසානය, සදාකාලයටම දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ භාග්‍යවන්තකම අත්දැකීම, මේවා නිසැකවම දැන් අපට හිමිව පවතින්නා වූ වස්තුවකි. නමුත් අපි මේවාට පහලින් ගමන් කරමින් සිටින විට (ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීමේ දී උරුම වන තෙක්) ඒ උදෙසා යාච්ඤා කිරීම නිශ්ප්‍රයේජනව තිබේ. දෙවියන් වහ්නසේගේ පුත්‍රයාණන් ප්‍රකාශවීමේ දී ඒවා අපට ලබාදීමට දෙවියන් වහන්සේ පිළිලෙ කර තිබෙන සේක. (රෝම 8:18-25)

තුන්වන අංශය වන්නේ යේසුස් වහන්සේගේ රුධිරය පූජා කිරීමෙන් අපට හිමිවන සමාව තුළ ඇති ආත්මික ආශිර්වාදයේ වස්තූන් වන අතර ඒවා හිමිකර ගැනීමට අපි ඉතා ඕනෑකමින් ක්‍රියාකරන්නේ නම් මිස ඒවා අප වෙත පැමිණෙන්නේ නැත. එඳු කාරණා වන්නේ මාංශයේ පාපවලින් මිදීම, මමත්වයෙන් ජයගැනීම, නිරන්තරයෙන් අපගේ පුද්ගලිකත්වය තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීමට ඉඩහැරීම, කිතුණු සේවයේ ඵලදායී ලෙස නිරතවීම, දෙවියන් වහ්නසේගේ අභිමුඛත්වයේ රැඳී සිටීමට දැන සිටීම, කරුණාව තුළ වර්ධනයවීම, දෙවියන් වහන්සේ සමඟ ඇති එකමුතුකමේ සම්බන්ධතාවය පිළිබඳ අවබෝධය, නොකඩවා ආත්මයෙන් පූර්ණව නමස්කාර කිරීම වේ. මේවා ඉබේම අප වෙතට නොපැමිණෙන අතර ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීමේ දවස දක්වා ඒවා හිමිකර ගැනීමට අපි ඒ උදෙසා ක්‍රියා කළ යුතුය. ඊශ්‍රායෙල් සෙනඟට පොරොන්දු වූ දේශය මෙන් අපගේ ඇදහිල්ල සහ ධෛර්යය වැඩිවන විට මේවා හිමිකර ගැනීමට හැකි වේ.

දේවල් පැහැදිලි කිරීම සඳහා දෙවියන් වහන්සේ අප ඉදිරියේ තබා ඇති මෙම ප්‍රීතියේ උරුමය හිමිකර ගැනීමට යෝජනා හතරක් ඔබ වෙත ගෙන ඒමට මට ඉඩදෙන්න.

(1) ඔබ ඒවා පසුපස නොගියොත් ඔබට කිසිවක් නොලැබෙනු ඇත.

කිසි දෙයක් වෙනුවෙන් දෙවියන් වහන්සේ ඔබට බලකරන්නේ නැත. යොෂුවාට පොරොන්දු දේශය හිමිකර ගැනීමට සටන් කිරීමට සිදු විය. ඔබගේ වාතාවරණය තළ අභියෝගවලට මුහුණ දෙමින් ඉදිරියට පැමිණෙන සතුරා කුමක් වුවත් සටන් කරමින් පරාජය කල යුතුය. පොරොන්දු දේශය ඔබ වෙතට නොඑන අතර ඔබ පොරොන්දු දෙශය වෙතට යා යුතුය. ඒ සඳහා ලේකයේ දේවලින් වෙන්ව තමාගේම අයිතිවාසිකම් අත්හැරිය යුතුය. මේ මාර්ගයේ ගමන් කරන්නේ කවුද ... ? කුරුසියේ මාර්ගයේදී බොහෝ ප්‍රීතියේ අවස්ථාවන් සහ දුක්විඳීම් බලාපොරොත්තු සහදුක් වේදනා, ආදී දේවලට මුහුණ දීමට සිදුවේ. සමහර ඒවා පරිපූර්ණත්වයේ ආත්මයේ ප්‍රතිඵල වන අතර සමහර ඒවා අසම්පූර්ණකමේ ප්‍රතිඵල වේ.

(2) ඔබ සතුව ඇති බව ඔබ අවධාරණය කරන තරමටම ඔබට ඒවා තිබිය හැකිය.

දෙවියන් වහන්සේ යොෂුවාට මෙසේ කී සේක. **"නුඹලා අඩිය තබන සියලුම ස්ථාන මා විසින් මෝසෙස්ට කී ලෙස නුඹලාට දුනිමි."** (යොෂුවා 1:3) බයිබලය පුරාම මෙම මූලධර්මය

ඒ.ඩබ්. ටෝසර් (1897-1963)

පවතින්නේය. ඊශ්‍රායෙල් ඉතිහාසය පිරී ඇත්තේ තම උරුමයට හිමිකම් කීමට නිර්භීතව කටයුතු කළ අයගේ කථාවලින්ය. උදාහරණයක් වශයෙන් කානාන් දේශය යටත් කර ගැනීමෙන් පසුව කාලෙබ් යොෂුවා වෙතට ගොස් මෝසෙස් තමාට පොරොන්දු වූ කඳුකරය ඉල්ලා එය ලබාගත්තේය. ඒ ආකාරයෙන්ම ශෙලේවේහාද්ගේ දූවරු මෝසෙස් ඉදිරියට ගොස් තමන්ගේ උරුමය ඉල්ලා සිටියෝය. මේ කාන්තාවන් එලෙස තමන්ගේ උරුමය ඉල්ලා සිට එය ලබාගත්තෝය. **"එකල යෝසෙප්ගේ පුත්‍රයා වන මනස්සේගේ වංශයවලින් මනස්සේගේ පුත්‍රවූ මාකීර්ගේ පුත්‍රයා වන ගිලියද්ගේ පුත්‍රවූ හේලේර්ගේ පුත්‍රයා වන ශෙලේවෙහද්ගේ දුවරු ළඟට ආහුණෝය. ඔහුගේ දුවරුන්ගේ නාම මාලා, නෝවා, හොග්ලා මිල්කා සහ තීශාය. ඔවුහු මෝසෙස්ද, පූජක වූ එලෙයාසර්ද, අධිපතීන් ද, මුළු සභාවද ඉදිරියෙහි ස්විමුඩවීමේ කූඩාරමේ දොරකට ළඟ සිට කථාකොට අපේ පියා කානාන්දේශයෙහි මළේය. ඔහු කෝරාගේ සමාගම වන ස්වාමීන් වහන්සේට විරුද්ධව රැස්වූණ සභාව අතරේ නොසිටියේය. ඔහු තමාගේ පාපය නිසාම මෙළේය. ඔහුට පුත්‍රයෝ නොසිටියෝය. අපේ පියාණන්ට පුත්‍රයෙකු නැති බැවින් ඔහුගේ නාමය ඔහුගේ වංශය අතරෙන් පහවෙන්ට ඕනෑ වක්නිසාද ... ? අපේ පියාගේ සහෝදරයන් අතරේ අපට උරුමයක් දුන මැනවයි කීවෝය. මෝසෙස් ඔවුන්ගේ කාරණය ස්වාමීන් වහන්සේ ඉදිරිපිටට ගෙනාය්ය. එවිට ස්වාමීන් වහ්නසේ මෝසෙස්ට කථාකොට ශෙලෝහෙහාද්ගේ දුවරුන් කියන දේ හරිය නුඹ සැබවින් ඔවුන්ගේ පියාගේ සහෝදරයන් අතරේ ඔවුන්ට උරුමයක් දිය යුතුය. ඔවුන්ගේ පියාගේ උරුමය ඔවුන්ට හිමිවෙන්ට සලසාපන්න."** (ගණන් කථාව 27:1-7) එය හිමිකර ගත්තේ මෝසෙස්ගේ කැමැත්ත පරිදි නොව නමුත් දෙවියන් වහන්සේගේ පොරොන්දුව තුළය. අපගේ ඉල්ලීම දෙවියන් වහන්සේට ගෞරවයෙක් වන විට අපට අවශ්‍ය තරම් ප්‍රමාණයෙන් ඉල්ලා සිටිය හැකිය. ඉල්ලීම අවදානමක් දැරීමට තරම් වැඩියෙන් තීර්භීත තරමට පිළිතුරු ලැබෙන විට දෙවියන් වහන්සේට වැඩි මහිමයක් ලැබෙනු ඇත.

5 පිටුවට

4 පිටවෙන්

හිමිකර නොගත් අපගේ වස්තුව...

(3) ඔබ සෑහීමට පත්වන තරමට ඔබට ලැබෙනු ඇත.

දෙවියන් වහන්සේ සෑම මනුෂ්‍යයෙකුටම නිදහස් කැමැත්ත දී තිබේ. නමුත් දෙවියන් වහන්සේ දී තිබෙන නිදහස් කැමැත්ත දේව භක්තියට වඩා අවශ්‍ය යැයි සිතීම නුසුදුසු දෙයකි. උදාහරණයක් වශයෙන් පරාජිත ජීවිතයක් ගත කිරීම පිළිබඳව සෑහීමට පත්ව සිටින මනුෂ්‍යයාට කිසි විටෙකත් ජයග්‍රහණය ලබා ගැනීමට බලකරන්නේ නැත. ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කිරීම තුළ සෑහීමට පත්ව සිටින මනුෂ්‍යයා කිසිදාක උන්වහන්සේගේ සමීපයේ දීප්තිය දැනගන්නේ නැත. ප්‍රීතියක් නොමැතිව සෑහීමට පත්වන පුද්ගලයා කිසිදාක ශුද්ධාත්මයාණන් වහන්සේගේ ප්‍රීතියේ අත්දැකීම තුළ ඵල නෙලාගන්නේ හෝ ඵලදායී ජීවිතයක ගැඹුරු තෘප්තිය අත්දකින්නේ නැත.

කිතුණුවන්ගෙන් කී දෙනෙක් හොඳම දේට වඩා අඩුවෙන් හිමිකර ගැනීම තුළ සෑහීමට පත්ව සිටිනවාද ඒ දෙස සැලකිල්ලෙන් බලන අයගේ ආත්මයට එය මහත් ශෝකයකි. තමන්ගේ අතීතයේ දී කොතැනක හෝ හදවතේ ශුද්ධ වූ ආශාවන් සමඟ පහළ මට්ටමේ එකඟතාවයකට පැමිණ සෑහීමට පත් වූ සහ තමන්ට කිසිසේත් නුසුදුසු ඇල්මැරුණු මධ්‍යස්ථ ආකාරයෙන් කිතුණු ධර්මය තුළ පවතින ක්‍රිස්තියානි අය අතරට ගිය විට පුද්ලිකව මම වසර ගණනාවක් ඔවුන් වෙනුවෙන් ශෝකයේ බර දරා සිටියෙමි. ඔවුන් ස්වාමීන් වහන්සේට සේවය කරන බව කියා සිටින අතර එවැනි අය සෑම තැනකම දකින්නට ලැබේ.

(4) දැන් ඔබට අත්තටම අවශ්‍ය තරම් තිබේ

සෑම මනුෂ්‍යයෙක්ම තමාට අවශ්‍ය පරිදි දෙවියන් වහන්සේට සමීප වේ. ඔහු තමාට කැමති ප්‍රමාණයෙන් ශුද්ධ සහ ආත්මයෙන් පූර්ණ වේ. අපගේ ස්වාමීන් වහන්සේ මෙසේ පැවසූ සේක.

"ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ ආශීර්වාද ලද්දෝය. එක්නිසාද ඔවුහු තෘප්තියට පැවිණෙන්නෝය." (මතවේ 5:6) පොළොවේ කොතැනක හෝ යම් කෙනෙක් ආත්මික කුසගින්නේ සහ තෘප්තිමත් නොවී සිටින්නේ නම් ඔහු ක්‍රිස්තුස් වහන්සේගේ වචනයෙන් ඇත්ව සිටියි.

ඒ අතරම අපි ප්‍රාර්ථනාවෙන් (බලාපොරොත්තුවෙන්) අවශ්‍යතාවය වෙන්කොට හඳුනාගත යුතුය. අවශ්‍යතාවය යනුවෙන් මම අදහස් කරන්නේ මුළු හදවතේ ඇති ආශාවයි. ඔවුන් ශුද්ධ හෝ ජයග්‍රාහී හෝ ප්‍රීතිමත් ලෙස ජීවත්වීමට ප්‍රාර්ථනා කරන නමුත් එය ලබා ගැනීමට දෙවියන් වහ්නසේ අපේක්ෂා කරන කොන්දේසි සපුරාලීමට කැමති නැත. නිසැකවම එබඳු බොහෝ දෙනා සිටිති.

දෙවියන් වහන්සේ විසින් මුදනු ලැබුවාවූ දරුවන් ඉදිරියේ අධ්‍යාත්මික වස්තුව සහිත විශාල ලෝකයක් තබා තිබේ. නමුත් එය ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ නොසලකා හරින්නේ නම් මැවීමේ ඉතිහාසයේ දී පළමු මනුෂ්‍යාගේ වැටීම මෙන් සදාචාරාත්මක වැටීමේ දෙවන විශාලතම බේදවාචකය බවට පහසුවෙන්ම පත්විය හැකිය.

යාච්ඤාව

යාච්ඤාවට වඩා පුද්ගලයෙකුව වෙනස් වන්නා වූ (උත්කර්ෂවත් ලෙස බැබලෙන්නා වූ) වෙනත් දෙයක් නොමැත. ඔබ යාච්ඤා කිරීම ගැන වැඩියෙන් කථා කරන්නේ ඇයි කියා මනුෂ්‍යයන් අසන්නෝය. පිළිතුර ඉතා සරලව තිබේ. මක්නිසාද යේසුස් වහන්සේත් එසේ කළ සේක. ලුක් සුභාරංචියේ සඳහන් කරන කාරණාවලට අනුව ලුක් සුභාරංචිය, යාච්ඤාවේ සුභාරංචිය ලෙස හැඳින්විය හැකිය. එය යේසුස් වහන්සේගේ ජීවිතයේ යාච්ඤාවයි. අනිත් සුභාරංචි කතෘවරුන් පවසන්නේ යේසුස් වහන්සේ යොර්දාන් ගඟේ සිටින විට ආත්මයාණන් වහන්සේ පරවියෙකු මෙන් උන්වහන්සේ මතට පැමිණි බවයි. ලුක් පවසන්නේ යේසුස් වහන්සේ යාච්ඤා කරන අතර ආත්මයාණන් වහන්සේ උන්වහන්සේ මතට පැමිණි බවයි. අනිත් සුභාරංචි කතෘවරුන් පවසන්නේ යේසුස් වහන්සේ ගෝලයන් දොළොස් දෙනෙකු තෝරාගත් බවයි. ලුක් පවසන්නේ මුළු රාත්‍රියේම යාච්ඤා කිරීමෙන් පසු යේසුස් වහන්සේ ගෝලයන් දොළොස් දෙනාව තෝරාගත් බවයි. අනිත් සුභාරංචිවල පවසන්නේ යේසුස් වහන්සේ කුරුසිය මත මැරුණු බවයි. ලුක් පවසන්නේ යේසුස් වහන්සේ කුරුසිය මත මරණයට පත්වෙද්දීත් උන්වහන්සේට පීඩා කරමින් සිටි අය උදෙසා යාච්ඤා කළ බවයි. අනිත් සුභාරංචි පොත්වල පවසන්නේ යේසුස් වහන්සේ කන්දට ගොස් අන්වෙසක් වූ බවයි. ලුක් පවසන්නේ උන්වහන්සේ යාච්ඤා කරමින් සිටින අතර අන්වෙසක් වූ බවයි. එහිදී යාච්ඤා කරමින් සිටි අතර අන්වෙසක් වීමට වඩා වෙනත් දෙයක් නොමැත.

ගෝලයන් නින්දේ පසුවෙද්දී යේසුස් වහන්සේ තමන් වහන්සේ වහන්සේගේ පුරුද්ද ලෙස යාච්ඤා කරන්නට ගිය බව ශුද්ධ ලියවිල්ලේ සඳහන් වේ. යාච්ඤා කිරීම උන්වහන්සේගේ පුරද්දක් වී තිබුණි. යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය. උන්වහන්සේ සේවයේ දී නිශ්චිතවම ආලේපය ඇතිව සිටි සේක. එසේ තිබියදී සියලුම අවශ්‍යතාවයන්වලදී යේසුස් වහන්සේට යාච්ඤා කිරීමට කාලයක් අවශ්‍ය වූවා නම්, ඔබටත් මටත් යාච්ඤා කිරීමට කාලයක් අවශ්‍යය නොවන්නේද ? යේසුස් වහන්සේට සෑම තීරණාත්මක අවශ්‍යතාවයකදී එය අවශ්‍ය වූවා නම්, ඔබටත්, මටත් සියලුම තීරණාත්මක අවශ්‍යතාවයන් වලදී එය අවශ්‍යය නොවන්නේද ?

මනරම් ගම්මානයකට ගිය සංචාරකයන් පිරිසක් වැවක් අයිනේ වාඩිවී සිටින මහළු මනුෂ්‍යයෙක්ව දුටු බව එම කථාවේ දැක්වේ. මේ ගම්මානයේ කොයි ආකාරයෙන් හෝ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් බිහිවූයේ නැද්දැයි එක් ආගන්තුකයෙකු සානුකම්පාවෙන් යුතුව අසීය. (තරමක අනුග්‍රහය දක්වන ආකාරයෙන් ඇසීය.) මහළු මිනිසා ඔළුව උස්සා නොබලාම "නැහැ ... බබාලා විතරයි ඉපදුනේ " කියා පිළිතුරු දුන්නේය. බලවත් මනුෂ්‍යයන් සියලුදෙනාම වරෙක බිළිඳුන් ලෙස සිටියෝය. බලවත් වූ ශුද්ධවන්තයන් සියුලදෙනා ද වරෙක ආත්මික කාරණා පිළිබඳව වැටි වැටී පියනයන ළදරුවන් මෙන් සිටියේය.

චාර්ල්ස් එච්. ස්පර්ජන් වයස අවුරුදු දහසයේ දී ගැලවීම ලබා වයස අවුරුදු දහනවයේ දී ලන්ඩන් නගරයේ දේශනා කරන්නට පටන් ගත්තේය. ඔහුට වයස අවුරුදු විසිහතේ දී එක්වර පුද්ගලයන් හයදාහකට වාඩිවිය හැකි දේවස්ථානයක් ගොඩ නැගීමට හැකි විය. ඉරිදා දිනයේ දී දේව මෙහෙයන් දෙකක් පවත්වනු ලැබූ අතර දේව මෙහෙයන් දෙකේදීම දේවස්ථානයේ ආසන සම්පූරණයෙන්ම පිරී යන බැවින් දොළොස් දහසක් දෙනා ඉරිදා දේව මෙහෙයන්වලට සහභාගි වේ. එය සිදුවූයේ කෙසේද ? චාර්ල්ස් ස්පර්ජන් බ්‍රහස්පතින්දා රාත්‍රියේ දෙවියන් වහන්සේ දෙස බලා සිටින්නේය. ඔහු දෙවියන් වහන්සේ සමඟ තනිවී, අධ්‍යයනය කරමින් යාච්ඤා කිරීමෙහි නිරත වන්නේය.

බලාපොරොත්තු බිඳවැටී තිබෙද්දී වඩා ඕනෑකමින් යාච්ඤා කිරීම

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සියලුම මනුෂ්‍යයන්ව තනිකම තුළ නිර්මානය කරන සේක. යාච්ඤාවේ රහස කුමක්ද කියා ඔබ දන්නවාද ? එනම් රහසින් යාච්ඤා කිරීමයි. **"නුමුත් නුඹ යාච්ඤා කරන කල්හි නුඹේ ඇතුල්ගෙට වැද දොර වසා, රහසිගතගව වසන නුඹේ පියාණන් වහන්සේට යාච්ඤා කරපන්න. එවිට රහසින් දකින නුඹේ පියාණන් වහන්සේ නුඹට විපාක දෙන සේක. "** (මතෙව් 6:6) දොර වසා තිබියදී කිසිවෙක් නොමැතිවිට ඔබට අනිත් අයට ඔබගේ දීමනා හෝ වෙනත් කිසිවක් ප්‍රදර්ශනය කළ නොහැකිය. ඔබට අනිත් මනුෂ්‍යයන්ව විශ්මයට පත්කළ හැකි වුවත් දෙවියන් වහන්සේව විශ්මයට පත් කළ නොහැකිය.

1 සාමුවෙල් 1:1-15 දක්වා පදවල එල්කානා ඔහුගේ භාර්යාව වූ හන්නා සමඟ අවුරුද්දකට වරක් ෂිලෝට යන්නාවූ චාරිකාව සහ ෂිලෝහිදී දෙවියන් වහන්සේට නමස්කාර කරමින් කරන්නා වූ පූජාව ගැන සඳහන් වේ. ඒ කාලය තුළ හන්නාට දරුවන් නොලැබුණු නිසා ඇය දැඩි වේදනාවට පත්ව සිටියාය. මෙම බයිබල් ඡේදය තුළ ඇගේ වඳභාවය පිළිබඳව අවධානයෙ යොමු කරමින් කළා වූ යාච්ඤාව ගැන සම්පූර්ණ විස්තරයක් අපට ලබාදෙයි. ඇගේ වේදනාව දරාගත නොහැකිව කඳුළු සලමින් ඇගේ ආත්මය ස්වාමීන් වහන්සේ ඉදිරියේ වැගිරෙව්වාය. ඇගේ ආත්මය ශෝකයෙන් පිරී තිබුණාය. ඇයට කෝපය ඇති කරවමින් ඇගේ ආත්මය වේදනාවට පත්කරනු ලැබුවාය.

වේදනාව, දැඩි දුෂ්කරතාවය සහ සියලුම පීඩාවන් ඇයට පැමිණ තිබුණ නමුත් සම්පූර්ණයෙන්ම වාතාවරණය වෙනස් කරන්නා වූ යතුර වූයේ ඇය යාච්ඤාවේ කාන්තාවක්වීම බව අනර්ඝ ලෙස දකින්නට ලැබේ. ඇය දෙවියන් වහන්සේගෙන් දරුවෙකු ඉල්ලා ගත්තා යැයි පැවසුවේය. **"තවද අවුරුද්දක් යන තැනදී හන්නා ගර්භනීව පුත්‍රයෙකු වැදුවාය. ඇ ...., මා ස්වාමීන් වහන්සේගෙන් ඔහු ඉල්ලාගත් බැවිනැයි කියා ඔහුට සාමුවෙල් යන නම තැබුවාය."** (1 සාමුවෙල් 1:20)

මනුෂ්‍යයන් කැමති නැති නමුත් මම නිතරම කියන දෙයක් තිබේ. දෙවියන් වහන්සේ පිළිතුරු ලබා දෙන්නේ නිකම්ම කරන්නා වූ යාච්ඤාවකට නොව බලාපොරොත්තු බිඳ වැටී තිබෙද්දී වඩා ඕනෑකමින් කරන යාච්ඤා කිරීමකට වන සේක. ඔබගේ යාච්ඤා ජීවිතය ඔබගේම ශක්තිය මත රැඳී තිබීම කොපමණ දුරට හඟවා දෙනවාද .. ? ඔබ ගායනා කරන විට ඇත්තටම ඔබගේ හදවතේ ඇදහිල්ල (විශ්වාසය) පවතින්නේ කෙලෙසද ..? තමා ගැනම විශ්වාසය තබා නැති නම් ඔබට වඩා වැඩියෙන් යාච්ඤා කළ හකැයි. ශුද්ධ ලියවිල්ලේ පවසන්නේ කුමක්ද ? දෙවියන් වහන්සේ පහත් සහ නැති දේ තෝරාගන්නා බවයි. ඇත්තා වූ දේවල් නැති කරන පිණිස නැති දේවල් වැනි ලෝකයේ පහත් දේවල් ද සුළුකොට සිතනු ලබන දේවල්ද දෙවියන් වහන්සේ තෝරා ගත් සේක. (1 කොරින්ති 1:28) එබැවින් උන්වහන්සේගේ අභිමුඛත්වය තුළ මාංශයට ගෞරවයක් නොමැත. අද දවසේ අපි දෙවියන් වහන්සේ විසින් තෝරාගනු ලබන්නා වූ කිසිවක් නැති කොටසට අයත් විය යුතුය.

6 පිටුවට

ලෙනාඩ් රවීන් හීල් (1907-1994)

5 පිටවෙන්

යාච්ඤාව...

දිළිඳුන්ගේ වචන

යාච්ඤා කිරීම දිළින්දෙකුගේ භාෂාවයි. ඊශ්‍රායෙල් රජවූ දාවිත් නැවත එය පැවසුවේය. **"ස්වාමීනි, ඔබගේ කන නමා වට උත්තර දුන මැනව. මක්නිසාද මම දුප්පත්වී, දිළින්දෙවි."** (ගීතාවලිය 86:1) තවත් ගීතිකාවක ඔහු ප්‍රබල ලෙස මෙලෙස කියා තිබෙනවා ඔබට මතක ඇති. **"මේ දුප්පතා මොර ගැසුවේය. ස්වාමීන් වහන්සේ ඔහුගේ බස් අසා ඔහුගේ සියලු දුක්වලින් ඔහු ගැලවූ සේක."** (ගීතාවලිය 34:6)

අපෝස්තුළු පාවුල් ඔහුගේ අධ්‍යාත්මිකත්වය, **ඔහුගේ පෙළපත, ඔහුගේ දැවැන්ත බුද්ධිය මගින් අපව පර්‍යාප්ත කරවින් අපට ඉඳිරියෙන් සිටියි. ඒ අතර ඔහු දුර්වලව සිටින කළ ඔහු ශක්තිමත් බව මනා ලෙස අවබෝධ කරගෙන සිටින බව පවසා ඇත. ඔහු සැම විටම උත්සාහ කළේ තමාට සහ අන් අයට තමා කිසිවෙකු නොවන බව ඔප්පු කිරීමටය.**

සැබෑ යාච්ඤා කිරීම දෙආකාර සන්නිවේදනයක් කරනු ලබයි. මම දෙවියන් වහන්සේට කථා කරන අතර දෙවියන් වහන්සේ මට කථා කරන සේක. ආත්මය සන්නිවේදනය කරන්නේ කෙසේද යන්න හෝ දෙවියන් වහන්සේට මගේ යාච්ඤා කිරීම අවශ්‍ය වන්නේ මන්දැයි මම නොදනිමි. නමුත් දෙවියන් වහන්සේ ක්‍රියා කරන්නේ ඒ ආකාරයෙනි.

නැගිටින්න සහ යාච්ඤා කරන්න.

එක් දවසක් මම දේවධර්මාචාර්ය වී. රේමන් එඩ්මන්ගේ සම්මන්ත්‍රණයකට සහභාගිවීමට එක් කිතුණු විද්‍යාලයකට ගියෙමි. ඔහු එහි සිටි මේ රටේ එක් විශිෂ්ඨ කිතුනු අධ්‍යාපනඥයෙනකි. ඔහු ඉක්වදෝරයේ මිෂනාරිවරයෙක් ලෙස සිටියදී ඔහුගේ සේවයේ අත්දැකීම අප සමඟ පැවසුවේය. ඔහු අසනීප වී මිය යාමට ආසන්නවීමට කලින් බොහෝ කාලයකට පෙර සිට එහි සේවයේ යෙදී සිටියේ නැත. තමා මරණයට ආසන්නව සිටිනිසා රේමන් එඩ්මන් තමාගේ සොහොන් ගෙය කපාගෙන තිබුණි. ඔහුගේ ඇහිබැමිවල දහඩිය විශාල පබළු ලෙස තිබූ අතර ඔහුගේ උගුරේ මරණ ඝෝෂාවක් විය. එක පාරටම ඔහු ඇදේ ඉඳගෙන, මට මගේ ඇඳුම් ගෙනත් දෙන්නැයි තමාගේ බිරිඳට කීවේය. සිදුවන්නේ කුමක්දැයි කිසිවෙකු දැන සිටියේ නැත. වසර ගණනාවකට පසුව ඔහු බොස්ටන් හිදී එම කථාව නැවත කියමින් සිටියේය. ඊට පස්සේ වයසක පොඩි ගැහැණු කෙනෙක් කුඩා පොතක් අතේ තබාගෙන ඔහු ළඟට ඇවිත් "ඔයා මැරෙනවා කිව්වේ කීයටද කියලා ඇසීය. ඉක්වදෝරයේ වෙලාවෙන් කීටයද ? " බොස්ටන් වෙලාවෙන් කීයටද ... ?" ඔහු ඇයට පිළිතුරු දුන් විට ඇගේ රැළි වැටුණු මුහුණ ආලෝකමත් විය. ඇගේ අතේ තිබුණ පොත පෙන්වමින් ඒක තියෙනවා ඔයාට පේනවාද ..? කියා ඇසීය. රේමන් එඩ්මන්ව සාතන් ඉක්වදෝරයේ දී මරා දැමීමට උත්සාහ කරනවා නැගිට යාච්ඤා කරන්නැයි පාන්දර 2.00 ට දෙවියන් වහ්නසේ ඇයට කී සේක. ඇය නැගිට යාච්ඤා කළාය. ඇගේ **යාච්ඤා කිරීම කරුණුකොටගෙන දෙවියන් වහන්සේ** රේමන් එඩ්මන්ව මරණයෙන් ගැලවූ සේක.

තම කෙතේ යාච්ඤා කරමින් සිටි ගොවියෙක් ගැන ඇසුණු කථාවක් ඩන්කන් කම්පබෙල් කීවේය. ගොවියා ග්‍රීසිය වෙනුවෙන් යාච්ඤා කරමින් සිටියේය. ඉන්පසුව කම්පබෙල් ඒ මනුෂ්‍යයාගෙන් ඇසුවේ ඔහු ග්‍රීසිය වෙනුවෙන් යාච්ඤා කරන්නේ ඇයි කියාය. මම දන්නේ නැහැ කියා ඒ මනුෂ්‍යයා කීවේය. මගේ ආත්මය තුළ මට බරක් දැණුන අතර ඔබ යාච්ඤා කරන්න යැයි දෙවියන් වහ්නසේ මට කී සේක. ග්‍රීසියේ දුෂ්කර වතාවරණයන්ට මුහුණ දෙන යම් කෙනෙක් සිටින්නට ඇති මම යාච්ඤා කළ විට මට නිදහසක් දැණුනා කියා ගොවියා වැඩිදුරටත් කීවේය. අවුරුදු දෙකකට හෝ තුනකට පසුව මේ ගොවියා යාච්ඤා රැස්වීමකට සහභාගි වී මිෂනාරීවරයෙකුගේ දේශනයකට සවන් දුන්නේය. මිෂනාරිවරයා තමා ග්‍රීසියේ සේවයේ යෙදී සිටි කාලය පිළිබඳව පැහැදිලි කළේය. ඔහු ඉතා අර්බුදකාරී දේවලට මුහුණ දී තිබුණේය. කොයි කාලයේදී ද අවුරුදුද දෙකකට හෝ තුනකට ඉහතදීය. ස්කොට්ලන්තයේ කුඩා දූපතක වෙරළ ආසන්නයේ සිටි ගොවියෙක් දෙවියන් වහන්සේ විසින් තමන්ට බරක් ඇති කළ නිසා තමා නමවත් නොදන්න ග්‍රීසියේ දේව සේවයේ යෙදී සිටි මනුෂ්‍යයෙක් වෙනුවෙන් යාච්ඤා කළේය. මේ කියන්නා වූ කාලය එකිනෙකාට ගැලපෙන බව මනුෂ්‍යයන් සෝදිසි කර බලා අවබෝධ කරගත්තෝය.

ස්වාමීන් වහන්සේ ඔබට අරුම පුදුම කාරනා ලබාදෙන බව මෙයින් පෙනෙන්නේය. ඔබට දෙවියන් වහන්සේ යම් දෙයක් ගැන කතා කරන්නේ නම් ඒ කුමක්දැයි කල්පනා කරමින් නොසිට දෙවියන් වහන්සේ ඔබට කියන්නා වූ දෙය ඉටුකරන්න.

ස්වාමීන් වහන්සේගේ කන්දට නගින්නේ කවුද .. ?

ඩන්කන් කැම්පබෙල් ස්කොට්ලන්තයේ සේවය කරන විට ලැබුවා වූ තවත් අත්දැකීමක් විස්තර කළේය. මට දේශනා කිරීමට නොහැකි විය. මට දෙවියන් වහන්සේ වෙතට යාමට නොහැකි විය. ස්වර්ගය තදින් වැසී තිබුණේය. එය හරියට අඩි දහයක ඝන වානේ සීලිමක් තිබුණක් මෙන් විය. කියා ඩන්කන් කැම්පබෙල් කීවේය. එම නිසා දේශනා කිරීමට උත්සාහ කිරීම ඔහු අතහැර දැම්මේය. තරුණයෙක් වූ ජෝන් කැමරන්ට යාච්ඤා කරන ලෙස ඔහු ඉල්ලා සිටියේය. මෙම තරුණයා නැගිට සිට මෙලෙස කීවේය. අපි දෙවියන් වහන්සේ සමඟ නිවැරදි නොවේ නම් යාච්ඤා කිරීමේ ඇති ප්‍රයෝජනය කුමක්ද ...? ඔහු ගීතාවලිය 24 වන ගීතිකාවේ වචන මෙසේ පැවසුවේය. **"ස්වාමීන් වහන්සේගේ කන්දට නගින්නේ කවුද .. ? "**

ඔබගේ දැත් පිරිසිදු නම් මිස ඔබට දෙවියන් වහන්සේ වෙතට ළඟාවිය නොහැකිය. එයින් අදහස් කරන්නේ අන් අය සමඟ ඔබගේ සම්බන්ධතාවය් පිරිසිදුව සහ ඔබගේ හදවත පිරිසිදුව තිබීමයි. **"ස්වාමීන්ගේ කන්දට නගින්නේ කවුද ... ? උන්වහන්සේගේ ශුද්ධස්ථානයෙහි සිටින්නේ කවුද ... ? පවිත්‍ර අත් සහ පිරිසිදු සිතක් ඇත්තා වූ තමාගේ ආත්මය නිශ්චලකමට යොමු නොකළා වූ, වංචාවෙන් නොදිවිලාවූ, තැනැත්තේමය. "** (ගීතාවලිය 24:3-4) ඉන්පසුව මෙම තරුණයා ගීතාවලිය 24 : වන ගීතිකාව කටපාඩමින් කියමින් යාච්ඤා කිරීමට පටන් ගත්තේය. ඔහු විනාඩි විස්සක් පමණ යාච්ඤා කළේය. ඉන්පසු ක්ෂණිකව එක්වරම පැවසුවේ මට සමාවෙන්න ස්වාමීනි ..., මම යක්ෂයාට විරුද්ධ වෙමි කියාය. ඔහු ආපසු හැරී යක්ෂයාට යා යුත්තේ කොතැනටද සහ එහි යන්නේ කෙසේද කියා පැවසීමට පටන් ගත්තේය. ඔහු වටිනා (වැදගත් වූ) සියලු දේ වෙනුවෙන් සටන් කරන්නට පටන් ගත්තේය. ඔහු තමාගේ යාච්ඤාව අවසන් කරන විට යක්ෂයාට විරුද්ධව කටයුතු කිරීම සම්පූර්ණ කර තිබුණේය. ඔහු ඒ වන විට විනාඩි හතලිස් පහක් යාච්ඤා කර තිබුණේය. ඔහු යාච්ඤා කර අවසන් වූ විට එය හරියට දෙවියන් වහනසේ ස්වර්ගයේ කුඩා ස්වචයක් දැමුවාක් මෙන් විය.

දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ එම සභාව වෙතට පැමිණි සේක. එම සභාව පිහිටා තිබූ ජන සමාජය වෙතට පැමිණි සේක. නගරයේ එක් කෙළවරක පිහිටා තිබූ නැටුම් ශාලව වෙතට ආත්මයාණන් වහන්සේ පැමිණි සේක. නගරයේ අනික් කෙළවරේ පිහිටා තිබූ තානායම වෙතට පැමිණි සේක. එම යාච්ඤාව තුළ මෙලෙස සෑම ස්ථානයකම දෙවියන් වහන්සේගේ ආත්මය වැගිරෙමින් පිඹිදීම පැමිණියේය.

අනාගතවකතෘ මලාකි එය පවසා තිබුනේ මේ ආකාරයෙනි. **"වෙන්න, මාගේ දූතයා එවමි. ඔහු මට පෙරටුව මාර්ගය පෘදන්නේය. එවිට නුඹලා සොයන ස්වාමීන් වහන්සේ හදිස්සියෙන් තමන් මාළිගාවට එන සේක. එසේය. නුඹලා ආශාවන ගිවිසුමේ දූතයා එන්නේ යයි සේනාවල ස්වාමීන් වහන්සේ කියන සේක."** (මලාකි 3:1) එහි එඩේරුන් ගැන සඳහන් කර තිබෙන්නේ මොනවාදැයි කල්පනා කර බලන්න. එඩේරුන් ඔවුන්ගේ රැළ දෙස රාත්‍රියේ දී බලා සිටින විට ක්ෂණිකවම ස්වර්ගීය සේනාවේ දූතයාගේ ශබ්දය ඇසුණේය. උඩුමහල් මැදුරේ ගෝලයන් එකසිය විසිදෙනා රැස්ව බලාසිටි අවස්ථාවේ දී සිදු වූ දේ ඔබට මතක තිබෙනවාද .. ? එම උඩුමහල් මැදුරේ කාමරය වෙතට උන්වහන්සේ පැමිණි සේක.

1737 අගෝස්තු 13 වන බාදාදා ඉතිහාසයේ ඉතා ප්‍රේමණීය දවසක් විය. මොරිවියාවේ මනුෂ්‍යයන් අතරෙ කුඩා කණ්ඩායමක් එදින යාච්ඤා කරමින් ස්වාමීන් වහන්සේ දෙස බලා සිටියෝය. වෙලාව රාත්‍රී 11.00 පමණ විය. හදිස්සියේම ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් අතරට පැමිණි සේක. සිදුවූයේ කුමකත්දැයි ඔබ දන්නවාද ? ඒ රාත්‍රියේ සිට අවුරුදු සියයක් වත් යන තුරු රාත්‍රී 11.00 වන විට ඒ හම යාච්ඤා කාමරය හිස් නොවීය. මා දන්නා ස්ත්‍රීන් සහ පුරුෂයන් අතරේ දීර්ඝතම යාච්ඤාව එයයි. වයස අවුරුදු හය හතක දරුවන් පවා තමන්ට උච්චාරණය කිරීමටවත් නොහැකි රටවල් උදෙසා යාච්ඤාවේ යෙදී සිටියාය.

අපි පිඹිදීම ලබා නැත්තේ ඇයි ?

අයර්ලන්තයේ පැරණි නගරය තුළ තරුණයන් හතර දෙනෙක් රාත්‍රියක් පාසා රාත්‍රියක් පිඹිදීම උදෙසා යාච්ඤා කළ ස්ථානයක් එහි යන අයට ඉතා ගෞරවයෙන් පෙන්වනු ලැබේ. වේල්සය තුළ කඳුකර ස්ථානයක වයස අවුරුදු 18-19 අතර වයසේ තරුණයන් තුන් දෙනෙක් හෝ හතර දෙනෙක් එකතුවී රාත්‍රියක් පාසා රාත්‍රියක් යාච්ඤා කළේය. ඔවුහු දෙවියන් වහන්සේට නිශ්චලව සිටීමට ඉඩ දුන්නේ නැත. ඔවුහු කිසි පිළිතුරක් භාර නොගත්තෝය. මනුෂ්‍යයන් වශයෙන් පිඹිදීමක් ආරම්භවීම හැකි පමණින් ඉල්ලා සිටියෝය. කිසිම අපහසුතාවයකින් (කැපකිරීමකින්) තොරව ඔබගේ සභාව උදෙසා ඔබ පිඹිකදීමක් ඉල්ලා සිටින්නේ නම් එය අමතක කර දමන්න. මන්ද පිඹිදීම සඳහා විශාල මිලයක් වැයවේ.

ඇමරිකාව තුළ අපි පිඹිදීම නොලැබීමට හේතු වන්නා වූ සරල කාරණයක් මම ඔබට පෙන්වා දෙන්නෙමි. මක්නිසාද පිඹිදීමක් නොමැතිව අපි තෘප්තියට (සෑහීමට) පත්ව සිටින නිසාය. අපි දෙවියන් වහන්සේව සොයන්නේ නැතිව, හාස්කම් සොයමින් විශාල කෲසේඩ් සොයමින්, ආශිර්වාද සොයමින් සිටින්නෙමු. ගණන් කථාව 11 : වන පරිච්ඡේදයේ දී මෝසෙස් දෙවියන් වහන්සේට මෙසේ කීවේය. **"තනියම වේ වුළු සෙනඟ දරන්ට මට බැරිය. ඔබ මට මෙසේ කරන සේක් නම්, ඔබගෙන් මට කරුණාව ලැබී නිබේ නම්. වහාම මා මරන ලෙස ඔබගෙන් ඉල්ලමි. අහෝ මාගේ කාලකණ්ණිකම මට දකින්ට නුදුන මැනවැයි කීවේය. "** (ගණන් කථාව 11: 14-15) දෙවියන් වහන්ස, පිඹිදීම එවන්න. නැතිනම් මාව මරා දමන්න කියා කියන තරමට ඔබ ඔබගේ දේශයට ප්‍රේම කරනවාද ... ? තමන්ගේ කාලයේ අයව වෙනස් වන පිණිස පැට්ට්‍රික් හෙන්රි යාච්ඤා කළේ කෙසේදැයි ඔබට සිතිය හැකිද ... ? මට නිදහස දෙන්න. නැතිනම්, මට මැරෙන්න ඉඩහරින්න කියා ඔහු යාච්ඤා කළේය.

7 පිටුවට

6 පිටවෙන්

යාච්ඤාව....

උත්පත්ති 30 : වන පරිච්ඡේදයේ බලාපොරොත්තු රහිත අවස්ථාවේදී රාබෙල්, යාකොබ් වෙතට ගොස්, **"මට දරුවන් දෙන්න, නැතහොත් මම නම්මියි යාකොබ්ට කීවාය."** (උත්පත්ති 30: 1) ඔබ දෙවියන් වහන්සේ ඉදිරියේ ඔබගේ ජීවිතය තබමින් අපගේ දේශයේ ආත්මික දරුවන්ගේ උපත වෙනුවෙන් දෙවියන් වහන්සේව සෙවීමට ඔබ සූදානම්ද ... ? මම ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව සිටිමියි මනුෂ්‍යයන් පවසන්නෝය. ආත්මයාණන් වහන්සේ පැමිණ ඔබගේ යාච්ඤා ජීවිතයේ විප්ලවීය වෙනසක් කර නැතිනම් ඔබ එය නැවත සෝදිසි කර බැලිය යුතුය. මන්ද දෙවියන් වහ්සේගෙන් ඔබට ලබා ගැනීමට අවශ්‍ය දේ ඔබ ලබාගත් බව මට එතරම් විශ්වාස නැත. යාච්ඥා කිරීම කාරණා වෙනස් කරන බව අපි පවසන්නෙමු. නැත..., යාච්ඤා කිරීම කාරණා වෙනස් කරන්නේ නැ. යාච්ඤා කිරීම පුද්ගලයන්ව වෙනස් කරන්නේය. වෙනස් වන්නා වූ එම පුද්ගලයන්ගේ කාරණාවන් වෙනස් කරන්නේය. අපි සියලුදෙනාම ග්‍රාබියෙල් කළා වූ කාරණය කිරීම අවශ්‍යය වේ. ඔබගේ ජීවිතයේ එය ඉටු කිරීමට මාගේ කරුණාව සහ ශක්තිය ඔබට සෑහෙන්නේ යැයි දෙවියන් වහන්සේ කියන සේක.

හන්නා ක්‍රියා කළාක් මෙන් අපි ක්‍රියා කළ යුතුය. ඇය කළේ කුමක්ද .. ? ඇය කඳුළු සැළුවාය., ඇය ශෝකයෙන් සිටියාය. ඇගේ දුක්ගැනවිල්ල ප්‍රකාශ කරමින් නිරාහාරයෙන් හිඳ යාච්ඤා කළාය. යේසුස් වහන්සේ දෙ**වියන්** වහන්සේගේ ආලේපලත් තැනැත්තා වූ සේක. එසේ වුවත් උන්වහන්සේ යාච්ඤා කිරීම උන්වහන්සේගේ පුරුද්දක් කරගෙන තිබුණු සේක. පාවුල්ගේ පසුබිම දෙස බලන විට ඔහු බුද්ධිමත්, ශක්තිමත් කෙනෙක් විය. නමුත් ඔහු යාච්ඤා කිරීම මත රැඳී සිටියේය. මක්නිසාද ඔහු දුර්වලව සිටින බව ඔහු පැවසුවේය. දාවිත් රජුව සිටියත් තමා දිළිඳු මනුෂ්‍යයෙක් යැයි කියමින් දෙවියන් වහන්සේට මොර ගැසුවේය. හන්නා පුත්‍රයෙක් වෙනුවෙන් යාච්ඤා කර අනාගතවකතෘවරයෙකුව බිහි කළාය. අතලොස්සක් වූ තරුණයන්ගේ යාච්ඤා කිරීම තුළ පිඹීදීමේ ගිණි පුපුර ඇති විය.

"යාච්ඤා කිරීමට වඩා පුද්ගලයෙකු වෙනස්වන්නා වූ වෙනත් දෙයක් නොමැත."

යාච්ඤාව සහ කුරුසිය

එෆ්.ජේ. හේගල් (1889-1971) විසිනි

ක්‍රිස්තුස් වහන්සේ තුළ අපගේ කුරුසපත්වීමේ ආලෝකයෙහි යාච්ඤා කිරීම පිළිබඳව සලකා බැලීමට ඉඩ හරිමු. දෙවියන් වහ්නසේ සමඟ සම්බන්ධ නොවන්නේ නම් යාච්ඤාවෙහි කිසිවක් නොමැත. ක්‍රිස්තුස් වහන්සේ තුළ පැරණි ජීවිතය හෙළාදැක මරණයට පත් කළ බැවින් පැරණි ජීවිතයට දෙවියන් වහන්සේ සමඟ ඇසුරක් තිබිය නොහැකිය. පැරණි ජීවිතය අවසන් කරන විට පමණක් දෙවියන් වහන්සේ සමඟ සැබෑ සම්බන්ධතාවය ඇතිකරගත හැකිය. බොහෝ දෙනෙකුට යාච්ඤාව එතරම් තෘප්තියට (සෑහීමකට) පත්නොවන දෙයක් බව සහ යාච්ඤා ජීවිතය ආකර්ෂණීය එකක් නොවන බව සොයා ගැනීමට එකම හේතුව ඔවුන් පරණ මනුෂ්‍යයාගේ ශක්තියෙන් යාච්ඤාවේ දිව්‍යමය තත්වයට ඇතුල්වීමට උත්සාහ කරන නිසාය. ලෞකික නොවී දෙවියන් වහන්සේ තුළ සිටිනවා වුවත් පරණ මනුෂ්‍යයාට ඔහුගේ සතුරට ප්‍රේම කිරීමට හෝ නිතරම ප්‍රීතිවීමට හෝ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මනස ඇතිව ජීවත්වීමට හෝ වෙනත් කුමන ආකාරයක හෝ කිතුනු අනුග්‍රහයන් සම්පූර්ණ කිරීමට වැනි ආයුධ පාවිච්චි කිරීමට නොහැකිය. පරණ මනුෂ්‍යයාට මෙම කරුණාවේ (අනුග්‍රහයේ) ආයුධ අනුකරණය කළ හැකිය. නමුත් ඇත්තටම කිසිම විටෙක ඔහුට ඒවා හිමිකර ගත නොහැකිය.

ඒවා ශුද්ධාත්මයාණන් වහන්සේගේ ගුණාංග වන්නේය. ඒවා පැමිණෙන්නේ ඉහළින්ය. ඒවා ඇදහිලිවත්යන්ට ලබා දුන්නා වූ ක්‍රිස්තුස් වහන්සේගේ ස්වභාවයේ ක්‍රියාකාරීත්වයන් වන අතර කුරුසියේ පදනම මත ඔහුගේ පැවැත්මට ඒවා ඇතුළත් කර ඇත. එනම් ක්‍රිස්තුස් වහන්සේගේ මරණයට පංගුකාරයන්වමෙන් පරණ මනුෂ්‍යාගේ ස්වභාවය ඉවත් කිරීමයි. ක්‍රිස්තුස් වහ්නසේ සමඟ අපගේ කුරුසපත්වීමේ පදනම මත පමණක් සැබෑ ලෙස යාච්ඤා කිරීමසට පුළුවන්කම ඇතුළත් කර ඇත. මෙය මූලික කොන්දේසියයි. **"නුඹලා වා තුළහේ පවතින්නෝ නම්, වාගේ වචනය නුඹලා තුළෙහි පවතී නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා. එවිට නුඹලාට ලැබේ."** (යොහාන් 15:7) අපි ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටිය යුතුය. නමුත් ගැලවුම් කරුවාණන්ගේ මරණයේ බලය තුළ පරණ ජීවිතය මරණයට පත්නොකර හෝ දෙවියන් වහන්සේ අපව දකිනා ආකාරයට ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියේ ඇණගසනු ලැබීමෙන් තොරව අපට සම්පූර්ණ අර්ථයෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටිය නොහැකිය.

ක්‍රිස්තුස් වහන්සේ සමඟ මරණයට පත්වීමේ සහ නැවත නැගිටීම තුළ ඇති අපගේ ඒකත්වය අපි අවබෝධ කරගත් විට ගැලවුම්කරුවාණන්ගේ ජීවනය, මුල් සභාවේ සිටි ශුද්ධවන්තයන්ගේ අත්දැකීම සහ ක්‍රියා පොතේ සඳහන් වන පරාජය කළ නොහැකි උද්යෝගය දැනගනු ලබන්නෝය. කුරුසියේ බලයෙන් මාංශමය සහ ආත්මීය පැටලීම් වලින් නිදහස් වී අපගේ ආත්මය රාජාලීන් මෙන් ඉහළ කඳු මුදුන් බලා පියාසර කරන්නේ එවිටය. සදාකාලිකව වාසය කරන අසීමිත ප්‍රියමනාප තැනැන්වහන්සේ සමඟ සහයෝගීතාවය ඇතිවන්නේ සහ ස්වභාවිකව එහි උපරීම පැවැත්මට පැමිනෙන්නේ එවිටය. නොනවත්වා යාච්ඤා කිරීමේ නිල නියෝගය පැමිණෙන්නේ ඉන් අනතුරුවය. මක්නිසාද එය නොතේරෙන ආඥාවක් වීම නවතින්නේ, ආත්මය මාංශයේ තෘෂ්ණාවෙන් නිදහස් වී, කල්වාරි ජයග්‍රහණයේ සම්පූර්ණ ප්‍රායෝජනය මගින් සාතන්ගේ සියලු පීඩා වලින් නිදහස්ව යාච්ඤා කිරීමට ස්වර්ගයේ සිටින ක්‍රිස්තුස් යේසුස් වහන්සේ සමඟ නැගී සිටීමට හැකි වන බැවිනි.

යාච්ඤා කිරීම සඳහා ජීවමාන දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ ශක්තිය ලැබෙන්නේ එවිටය. සියලු ආත්මාර්ථකාමී කාරණා වලින් නිදහස් වන තෙක් එය සිදු විය නොහැකිය. එහිදී වචනයෙන් කිව නොහැකි තරම් අවස්ථාවලදී කෙදිරිගාන නමුත් කඳු මුදුනට ගමන් කිරීම අසාර්ථක වන්නේ සහ සම්පූර්ණ කර ගැනීමට නොහැකි වන්නේ නැත. යාච්ඤා කිරීම දෙවියන් වහන්සේගේ කැමැත්තේ ක්‍රියාවක් බවට පත්වන්නේ එවිටය. එබැවින් මුහුණ දෙන්නා වූ දුෂ්කතරාවයන් මොනවා වුවත් පොර බදන්නාවූ ප්‍රශ්න කොයි ආකාර වුවත්, අවශ්‍යතාවයන් කොපමණ විශාල වුවත් ජයග්‍රහණය ලැබිය යුතුය. යාච්ඤාවට පිළිතුරු ලැබෙන බව ස්වාමීන් වහන්සේ පැවසූ දේවල විශාල වෙනස සහ මිලියන ගණනකගේ සැබෑ ව්‍යවහාරයේ පවතින කාලකණ්ණි ස්වභාවය ඉවත්කර යාච්ඤාව එහි සැබෑ ස්වභාවයේ සියලු තේජසින් මල් පිපෙන්නේ එවිටය.

යාච්ඤාවේ බලවත් වීරයන්

කුරුසියේ ආලෝකය තුළ යාච්ඤාව දකින අතර අපගේ ගැලවුම්කරුවාණන්ගේ මරණය සහ නැවත නැගිටීමට අපගේ සම්බන්ධවීම තුළ සභාවේ සමහරුන් යාච්ඤාවේ බලවත් වීරයන් ලෙස ඔවුන්ගේ කාර්යය ඉෂ්ඨකිරීම පිළිබඳව සුළු වශයෙන්වත් අපි මවිතයට පත්වන්නේ නැත. හඩ්සන් ටේලර් සහ ඔහු සමඟ සිටියා වූ සේවකයන් ස්වල්ප දෙනෙක් චීනය තුළ දහසක් දේවසේවකයන් ඇතිවන පිණිස යාච්ඤා කළේය. එහි ප්‍රතිඵලය වූයේ දහසක් නොව මිලියනයකට අධික සේවකයන් සංඛ්‍යාවක් දෙවියන් වහන්සේ ඔවුන්ට ලබා දුන් සේක.

ජෝර්ජ් මුලර් බ්‍රිස්ටල් නගරයේ දී කළ යාච්ඤාවට පිළිතුරු ලෙස ඔහුගේ අනාථ දරුවන්ගේ සේවය උදෙසා මිලියන ගණන් ඩොලර් දෙවියන් වහන්සේගෙන් ලබා ගත්තේය.

ඩේවිඩ් බර්නර්, මහත් පිඹීදීමක් ඇති නව එංගලන්තයක් උදෙසා දෙවියන් වහන්සේ සමඟ පොරබැදුවේය. ඔහුගේ ප්‍රේමණීයයන් අතරේ පමණක් නොව ඉන්දියානුවන් සහ ලොව වටා සෑම තැනකම ආත්ම (මනුෂ්‍යයන්) අස්වැන්න ලෙස එක්රැස් කරන පිණිස යාච්ඤා කළේය. එහි ප්‍රතිඵලය ලෙස ඉතිහාසයේ පමණක් නොව වර්තමානයේදී ද මහත් සේවාවන් ඒ තුළින් ගොඩනැගී ඇත. එවැනි අයගේ ජීවිතවල ඔවුන්ගේ කාර්යය සම්පූර්ණ වී ස්වාමී වූ යේසුස් වහන්සේගේ ක්‍රියාව සහ උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය අවබෝධ කරගත්තේය. පාවුල්තුමා මෙන් ඔවුන් ද උන්වහන්සේගේ දුක්විඳීම තුළ උන්වහන්සේ සමඟ සම්බන්ධකම් පැවැත්වූවෝය. **"යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැවිණෙන ලෙස, උන්වහ්නසේ සහ උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලයත්, උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය."** (පිලිප්පි 3:10-11)

ක්‍රිස්තුස් වහන්සේගේ මරණය සහ ජයග්‍රහණය බෙදාගන්න.

ජාතීන්ව වසාගෙන ඇති ආර්ථික සහ සදාචාරාත්මක දුක්වේදනා සහිත තීරණාත්මක මහා ලෝක අර්බුදය කිතුණු සභාවේ ආත්මික දුර්වලකම නිසා විය යුතු නොවේද ... ? ජාතීන් මුදාගැනීම උදෙසා සභාව දිව්‍යමය ඒජන්තවරයා වන්නේය. එදා මෙදා තුර මොරගසන අවශ්‍යතාවය නම් සැමවිටම සිදුවූවාක් මෙන් ආත්මාර්ථකාමී රක්ෂයා මනුෂ්‍යයන්ගෙන් හදවත්වලින් පලවා හැරීම සහ ජාතීන්ගේ ජීවිතවල ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය නිදහසේ ගලායාමට දොරටු විවෘතවීම උදෙසාය. ජාතීන් වෙතට ගෙන ඒමට හැකි වෙනත් සුවයක් නොමැත.

අපි සැබෑ කිතුණුකමට ඉඩ නොදෙන්නේද .. ? අපගේ ජීවිතවල ඇති අපගේම කැමැත්ත අත්හරින්නේ නැතිනම්, ක්‍රිස්තුස් වහන්සේට අපව අයිතිකර ගැනීමටත්, උන්වහන්සේ අපට පොරොන්දු වුනාවූ ජීවමාන ජලය ඇති ගංගා අප තුලින් ගලායාමට සැලැස්වීමටත් උන්වහන්සේට නොහැකිය. අපගේ හදවත් වලින් සුවය ගලායාමටත්, අපව නැවත ප්‍රකෘතිමත් කිරීමටත්, වෙනස් කිරීමටත්, ශක්තිය (බලය) අධික ලෙස ලබාදීමටත් නොහැකිය. අපගේ ජීවිතවල

8 පිටුවට

Reg. No: DOP/NEWS/21/2023
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

7 පිටවෙන්

යාච්ඤාව සහ කුරුසිය...

පැරණි ආත්මාර්ථකාමී අත්තිවාරම මත ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ ගොඩනැගිල්ල ගොඩනගන්නේ නැත. එය හුදෙක් අපගේ ජීවිතයේ යම් යම් දේවල් අප විසින්ම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක් නොව නමුත් අපගේ ජීවිත සම්පූර්ණයෙන්ම අත්හැරීමයි.

ක්‍රිස්තුස් වහන්සේ අපව උන්වහන්සේගේ කුරුසිය වෙතට ගෙන තිබෙන සේක. ආදම්ගෙන් පැවත එන පරණ මනුෂ්‍යයාගේ ජීවිතය කල්වාරියේ දී අවසන් වන්නේය. යේසුස් වහන්සේව ඇණ ගැසුවාවූ මනුෂ්‍යයන් උන්වහන්සේ **නින්දිතයෙකු ලෙස පයින් පැහැගෙන ලෙස සාදවි කාද්දී අපට ජීවනය ලැබෙන පිණිස අපරාධකාරයන් දෙදෙනෙකු වැද කුරුසියේ එල්ලීමට කැමති වූ ගැලවුවිකාරවොණන්ගේ ප්‍රේමයෙන් අපව පෙළඹවීමට යොමු කරන පිණිස ඉඩ හරිමු. කුරුසියේ ඇණ ගැසීමට ප්‍රතිචාරය දැක්වූ අයගේ සිතාගත නොහැකි දැඩි ආශාවන්ට යටත් වෙමු.**

යේසුස් වහන්සේ උන්වහන්සේගේ කුරුසිය අප සමඟ බෙදාගත් සේක. ලෞකික මනසින් අපව වෙන්කරගෙන දෙවියන් වහන්සේ සමඟ සතුරන්ව සිටීමෙන් වෙන් කරගෙන උන්වහන්සේගේ මරණයට අපවත් පංගුකාරයන් කරගත් සේක. අපි උන්වහන්සේගේ මරණය තුළට බොහිස්ම වූයෙමු. (රෝම 6:3) අපි ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කරනවා නම් උන්වහන්සේ පාපයට මැරුණේය යනු පාපයට අපගේ මරණයයි. උන්වහන්සේගේ නැවත නැගිටීම යනු අපගේ නැවත නැගිටීමයි. උන්වහන්සේගේ ජයග්‍රහණය අපගේ ජයග්‍රහණයයි. උන්වහන්සේගේ ඔසවා ගැනීම අපගේ ඔසවා ගැනීමයි. දෙවියන් වහන්සේ කරුණාවේ දීමනාව අපට සම්පූර්ණයෙන්ම උරුමකර දුන් සේක. එම නිසා අපට අතිශය ජයග්‍රාහකයන් වීමට පුළුවන. **"ඉතින් නුඹලා නොපැකිලෙන ලෙස ආරක්ෂා කරන්ටත්, මහත් ප්‍රීතියෙන් යුක්තව උන්වහන්සේගේ තේජස ඉදිරියෙහි කැළැල් රහිතව තබන්ටත් සමර්ථ වූ අපගේ ගැලවුවිකාර වූ එකම දෙවියන් වහන්සේට අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරුණාකොටගෙන ගෞරවයද, මහන්තත්වය ද, පරාක්‍රමයද, බලයද සියලු කාලවලට පූර්වයෙන් සහ දැනටත් සදාකාලේටත් වේවා. ආවේන .....!"** (යුදස් 24, 25)

ක්‍රිස්තුස් වහන්සේ තුළ පැළදී සිටින පවුලක්

කිම් බට්ස් විසිනි

"යක්ෂයාගේ උපායවලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන්වන පිණිස දෙවියන් වහනසේගේ සියලු යුද්දායුධ පැළඳගනිල්ලා. මක්නිසාද අපගේ පොරබැඳීම වනාහී මාංශයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත්, පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාර ලෝක ව්‍යාදානීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ඨකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. එබැවින් නපුරු දවසේදී වරුද්ධව සිටින්ටත්, සියල්ල සම්පූර්ණ කරගෙන ස්ථිරව සිටින්ටත් පුළුවන් වන පිණිස දෙවියන් වහන්සේගේ සියලු යුද්ධායුධ අරගනිල්ලා" (එපීස 6:11-13)

මෙම බයිබල් පදවල දෙවියන් වහන්සේගේ යුද්ධායුධ සම්පූර්ණයෙන්ම අපි පැළඳගෙන සිටිය යුතු බව පැහැදිලිව සඳහන් කරන්නේය. මෙම පද කිහිපය තුළ එසේ කළ යුතු බව දෙවරක් සඳහන් කර ඇත. අපි ආත්මික යුද්ධායුධ පැළඳසිටීම ස්වාමීන් වහන්සේට අවශ්‍යව තිබෙන්නේ ඇයි ... ? එයින් සාතන්ට විරුද්ධව අපට නැගී සිටීමටත්, එමෙන්ම නපුරු ආත්ම පැමිණෙන විට අපගේ ස්ථානයේ සිටීමටත් අපට හැකිවේ.

කිතුණුවන්ට ආරක්ෂිත ඇඳුම් ඉතා වැදගත්ව තිබේ. අපි අපගේ ජීවිත වෙනුවෙන්, අපගේ දරුවන්ගේ ජීවිත වෙනුවෙන් සහ විනාශ වී සිටින මනුෂ්‍යයන්ගේ ජීවිත වෙනුවෙන් අපි සටන් කළ යුතු බව අවබෝධ කරගන්නේ නැති නම් අපි වේදනාත්මක බිඳවැටීමකට (හානියකට) සහ පරාජයකට පත්වන්නෝය. පරීක්ෂාවන් පැමිණෙන විට අපි අපගේ ස්ථානයේ සූදානම්ව සිටිනවාද ... ? පීඩාවන් පැමිණෙන විට අපි යුද්ධායුධ පැළඳගෙන ස්ථිරව ඒවාට විරුද්ධව නැගී සිටිනවාද ...? කිතුණු පවුල් සාතන්ගේ ආක්‍රමණය කිරීමට මුහුණ දෙන්නෙය. දවසේ සෑම මොහොතකම අපි යුද්ධායුධ පැළඳ සිටිය යුතුය. මක්නිසාද ඕනෑම අංශයකින් අපව ආක්‍රමණය කළ හැකිය.

ඔබ ආත්මික යුද්ධායුධ පැළඳ සිටින්නේ කෙසේද .. ? පවුල් එකින් එක්කෙනා ඔවුනොවුන්ගේ වැඩ රාජකාරිවලට පිටත්ව යාමට පෙර යාච්ඤාවෙන් පූර්ණව ආත්මික යුද්ධායුධ පැළඳගත යුතු බව මම යෝජනා කරමි. එකිනෙකා නිවසින් පිටත්වීමට පෙර ආත්මික සටන අවබෝධ කරගෙන උද්යෝගිමත්ව යාච්ඤා කළ යුතුය.

ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඔබගේ යුද්ධායුධ පැළඳගන්න

අපගේ වේගවත් ගමන තුළ කාර්යබහුල සංස්කෘතිය තුළ පවුලක් ලෙස වැය කිරීමට කාලය සොයා ගැනීම දුෂ්කර වේ. සමහර විට අපි අවදානම අවබෝධ කරගන්නවා නම් සෑම දවසකම අපගේ ජීවිතවලට ආත්මික යුද්ධායුධ පැළඳ ගැනීමට යාච්ඤාවෙන් පූර්ණව කාලය වැය කරන්නෙමු. ඔව්, දෙවියන් වහන්සේට අපගේ දරුවන්ගේජීවිතවලට සැලැස්මක් තිබෙන සේක. නමුත් සාතන්ටත් සැලැස්මක් තිබේ. එබැවින් යුද්ධායුධ පැළඳගැනීමේ ආඥාවට තීරණාත්මකව කීකරුවීම පමණක් නොව පාවුල්තුමා රෝම යැවුම් පත්‍රයේදී කියන දෙයටත් කීකරු විය යුතුය.

"නුවුත් තෘෂ්ණා පූර්ණ කරන පිණිස මාංසයට පංගාකවක් නොකොට ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පැළඳගනිල්ලා" (රෝම 13:14) පාවුල්තුමා අවධාරණය කරන්නේ ගැලවුම්කාර ස්වාමීන් වහන්සේ වන ක්‍රිස්තුස් යේසුස් වහන්සේ අපගේ ඇතුලාන්තයේ සිටින විට එහි ප්‍රතිඵලය ලෙස පිටතින් සිදුවන්නේ කුමක්ද කියාය. අපගේ ජීවිතවල සියලු ක්‍රියාවලින් අපගේ පවුලේ අයට, අපගේ මිතුරන්ට,අප වටා සිටින ලෝකයේ අයට යේසුස් වහන්සේව අනාවරණය විය යුතුය. පාපිෂ්ඨ ස්වභාවය සෑමවිටම මතු පිටට යටින් සැඟවී තිබේ. කෙස් වෙතත් අපි යේසුස් වහන්සේව පැළඳ සිටිනේ නම්, අපි වඩ වඩා උන්වහන්සේ මෙන් වන්නෙමු.

මම දෙවියන් වහන්සේගේ යුද්ධායුධ පැළඳගෙන සිටින අතර ඒ මොහොතේම ක්‍රිස්තුස් වහන්සේවත් පැළඳ සිටිනේ නම් දැඩි ලෙස සතුටින් ප්‍රමෝදයට පත්වන්නෙමි. උදාහරණයක් වශයෙන් සැබෑකම නැමති ඉඟපටිය මම පැළඳ සිටින විට (එපීස 6:14) මම සත්‍යතාවයේ පුද්ගලයාණන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේවත් මම පැළඳ සිටින්නෙමි. මම ධර්මිෂ්ඨකමේ ළයවැස්ම පැළඳ සිටින විට (එපීස 6:14) යේසුස් වහන්සේව පැළඳ ගැනීමට අවනතවීමෙන් උන්වහන්සේ මගේ ධර්මිෂ්ඨකම වන සේක. උන්වහන්සේ සමාදානයේ සුභාරංචියයි. (සමාදානයේ සුභාරංචිය නැවති පාවහන්) උන්වහන්සේ අපගේ ගැලවීමයි. (ආරක්ෂක තොප්පිය) ඇදහිල්ල නැමති පළිහ අරගන්න. එවිට යේසුස් වහන්සේව පැළඳගැනීම ඇදහිල්ලෙන් කරන්නෙමු. දෙවියන් වහන්සේගේ වචනය නැමති ආත්මයාණන් වහන්සේගේ කඩුවද ගෙන යාච්ඤා කිරීමද පැළැඳගන්න.

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.